JMC vLearning
"your virtual learning partner"

සීමිත සමාගම් සඳහා ගිණුම්කරණය

රුක්මල් විජේකෝන්

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

සීමිත සමාගම් සඳහා ගිණුම්කරණය

සමාගම් පිළිබඳ මූලික හැඳින්වීම

සමාගමක් යනු :

නීතිමය පුද්ගලභාවයක් හිමි සමාගම් පනත යටතේ ලියාපංදිචි කර ක්‍රියාත්මක වන්නා වූ නෛතික ඒකකයකි.

ශ්‍රී ලංකාවේ සමාගම් සම්බන්ධයෙන් බලපානු ලබන නීති

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත -මේ යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ඉදිරිපත් වේ. (LKAS)
- 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත -2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 1987 අංක 36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත
- කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි වීමට බලපාන ලැයිස්තුගත වීමේ නීති

වර්තමානයේ සමාගම් සම්බන්ධ 2007 අංක 07 දරණ නව සමාගම් පනත බලපානු ලබයි.

2007 අංක 07 දරණ සමාගම් පනත

ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් බලපවත්වනු ලබන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනතයි. මෙය පැරණි ,1982 අංක 17, දරණ සමාගම් පනත වෙනුවට හඳුන්වා දෙනු ලැබුවකි.

2006 මැයි 19 වන දින ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නව සමාගම් නීතිය ගැසට් නිවේදනයේ පල කරන ලදී. 2006 ඔක්තෝබර් 20 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුල මෙම පනත ඒකමතිකව සම්මාන විය. 2007 මාර්තු 20 වන දින ගරු කථානායකතුමා ඊට අත්සන් තැබීමත් සමඟ නව පනත මෙරට ක්‍රියාත්මක විය යුතු නීතියක් බවට පත් විය. 2007 අප්‍රේල් 20 වන දින අංක 1493/20 දින අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි පළ කිරීම පාරිභෝගික හා වෙළඳ කටයුතු ඇමතිතුමා මගින් සිදු විය.

2007 මැයි 03 වන දින සිට නව සමාගම් පනත ශ්‍රී ලංකාවේ සමාගම් සම්බන්ධව නව සමාගම් පනත වශයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනත ක්‍රියාත්මක වීම ඇරඹිණ.

2007 මැයි 03 වන දින සිට නව සමාගම් පනතට අදාල වෙමින් පැරණි 1982 අංක 17 දරණ පනත යටතේ ලියාපදිංචිව සිටි සමාගම් පනත බල පැවැත්වෙන දින සිට වසරක කාලයක් ඇතුලත ලියාපදිංචි අංකයක් යටතේ සංස්ථාපනය විය යුතුය.

නව සමාගම් පනත පරිච්ඡේද 43 කින් හා වගන්ති 534 න් සමන්විත උපලේඛණ 13 කින් යුක්ත වූවක් වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ගිණුම්කරණ හා සම්බන්ධ විදිවිධාන

සමාගම් පනතේ 166 වගන්තිය

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

වාර්තා කරන දිනයේ සිට මාස 06 ඇතුළත සෑම සමාගමක්ම වාර්ෂික වාර්තා පිළියෙළ කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ

සමාගම් පනතේ 167 වගන්තිය

වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීමට දින 15 කට පෙර වාර්තා සෑම කොටස් හිමියකුටම ලබාදිය යුතුයි

සමාගම් රෙජිස්ටාර්වරයා විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක හෝ වාර්තා කරන දිනයේ සිට මාස 06 ක කාලයක් තුල සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කලයුතු සමාගමක් විසින් පවත්වාගත යුතු පොත්පත්

1. සමාගමක් තම මුදල් ලැබීම හා ගෙවීම් පිළිබඳ වාර්තා
2. වත්කම් වගකීම් පිළිබඳ වාර්තා
3. භාණ්ඩ වෙළදාම සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් පිළිබඳ වාර්තා
4. අවසන් තොග වාර්තා
5. සේවා සැපයීම් සම්බන්ධයෙන් සේවා වාර්තා

සමාගමක් ලියාපදිංචි කිරීම

සමාගම් පනත යටතේ 4 වෙනි වගන්තිය අනුව,සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුයි

1. පවතින සමාගමක නාමය හා සමාන නාමයක් ලියාපදිංචි කරන සමාගම සඳහා භාවිතා නොකර ඇති බවට ප්‍රකාශයක්.
2. සාංගමික ව්‍යවස්ථාවලිය ්රචිසපජකැ දේ්දජස්චිසදබ*
3. අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කිරීමට මුල් අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත.
4. ලේකම් ලෙස කටයුතු කිරීමට මුල් ලේකම්ගේ කැමැත්ත.

ඉහත ලියවිලි ඉදිරිපත් කිරීමේදී **සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිර්දේශ කර ඇති පරිදි අදාළ ආකෘති පත්‍ර තුළින් අයදුම් කළ යුතුය.** එම **ලියාපදිංචි අයදුම්පත්‍රය** මුල් කොටස්කරුවන් (Initial Shareholders) අත්සන් කළ යුතුයි

- ඉහත ලියවිලි ඉදිරිපත් කොට සමාගමක් ලෙස ලියාපදිංචි කළ පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් "සංස්ථාගත කිරීමේ සහතිකය" (ලියාපදිංචි සහතිකය) (Certificate of Incorporation) නිකුත් කරනු ලබයි.

සාංගමික ව්‍යවස්ථාවලිය (Articles of Associatins)

සමාගමේ අභ්‍යන්තරික පාලනයට අදාළ වන ව්‍යවස්ථා සහ කොන්දේසි ඇතුලත් වන ලියවිල්ල ''සාංගමික ව්‍යවස්ථාවලිය" ලෙස හඳුන්වයි. සමාගමේ මුල් කොටස්කරුවන් මෙම ලියවිල්ලට අත්සන් කළ යුතුය. සමාගමේ අභිමතය පරිදි වෙනමම ලියවිල්ලක් සැකසීම හෝ සමාගම් පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් ආදර්ශ ව්‍යවස්ථාවලිය භාවිත කිරීම් අවස්ථාව පවතී. සමාගම් පනතට අනුව සාංගමික ව්‍යවස්ථාවලියක් අලුතින් සැකසීම කළ යුතුය. මෙහි ඇතුලත් කළ යුතු කරුණු අතර පහත දෑ වැදගත් වේ.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. සමාගමේ පරමාර්ථය
2. කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ කළමනාකරණය හා පරිපාලනය

සමාගම් පනතේ 15(1) වගන්තිය අනුව සමාගමට විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් සාංගමික ව්‍යවස්ථාවලි සැකසීම, සංශෝධනය කිරීම වැනි දෑ කළ හැක. එවැනි වෙනස්කම් කළ විට වැඩ කරන දින 10 ක් ඇතුලත සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඒ පිළිබඳ දැනුවත් කිරීම් කළ යුතුය.

සංස්ථාගත කිරීමේ සහතිකය (Certificate of Incorporation)

සමාගමක් ලියාපදිංචි කළ පසු සමාගමට අදාළ අංකයක් සහිතව ලියාපදිංචි කළ බව දක්වමින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන සහතිකය "සංස්ථාගත කිරීම් සහතිකය" ලෙස හඳුන්වයි.



සමාගම් පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන වශයෙන් සමාගම් වර්ග 03 ක් හඳුනාගෙන ඇත.

1. සීමාසහිත සමාගම් (Limited Companies)

කොටස්කරුවන්හට නිකුත් කරන ලද කොටස් ප්‍රමාණය මත සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති කොටස් ප්‍රමාණය සම්බන්ධව වගකීමට බැදෙන කොටස්කරුවන්ගෙන් සමන්විත සමාගම් සීමාසහිත සමාගම් ලෙස හඳුන්වයි. සීමාසහිත පෞද්ගලික සමාගම් සහ සීමාසහිත පොදු සමාගම් ලෙස කොටස් 02 ක් සීමාසහිත සමාගම් සම්බන්ධව හඳුනාගත හැක.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

2. සීමාරහිත සමාගම් (Unlimited Companies)

සාංගමික ව්‍යවස්ථාවලියේ පරිදි නිකුත් කල කොටස් ප්‍රමාණයට පමණක් නොව බැරකම් පියවීමකදී සීමාවකින් තොරව පෞද්ගලික වත්කම් වැය කිරීමට කොටස්කරුවන්ට සිදුවන සමාගම් ස්වරූපයකි.

3. ඇපයේ සීමාසහිත සමාගම් (Companies Limited by Guarantee)

සමාගම ඈවර කිරීමේදී එක් එක් සාමාජිකයා විසින් දායක විය යුතු කිසියම් ප්‍රමාණයක් සාංගමික ව්‍යවස්ථාවලියේ නිශ්චිතව සඳහන් කර ඇති සමාගම් ඇපයෙන් සීමිත සමාගම් ලෙස හඳුන්වයි.

පෞද්ගලික සහ පොදු සමාගම් (Private & Public Company)

සීමිත පෞද්ගලික සහ සීමිත පොදු සමාගම් සම්බන්ධව පහත වෙනස්කම් හඳුනාගත හැක.

පෞද්ගලික සමාගම්	පොදු සමාගම්
සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් සහ උපරිමය 50 කි.	සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් හා උපරිමය සීමාවක් නොවේ.
කොටස් සහ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නොමැත.	කොටස් සහ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකිය.
අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 1 ක් සහ උපරිමය සීමාවක් නොවේ.	අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 2 ක් සහ උපරිමය සීමාවක් නොවේ.
කොටස්හිමියන්ගේ ඒකමතික යෝජනා සම්මුතියකින් සම්බන්ධතා රෙජිස්ටරයක් පවත්වාගෙන යාමෙන් වැලකිය හැක.	සම්බන්ධතා රෙජිස්ටරයක් පවත්වා ගෙනයාම අනිවාර්ය වේ.
කොටස්කරුවන්ගේ ලිඛිත එකඟතාවයන් මත සමාගම් පනතේ සමහර විධි විධාන අනුගමනය කිරීම අවශ්‍ය නොවේ.	එවැනි සහනදායී කොන්දේසි සීමිත පොදු සමාගම් වලට නොලැබේ.
ණය ගෙවීම් හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව බෙදාහැරීම් කළ හැකි අතර අධ්‍යක්ෂකවරු පෞද්ගලිකව වගකීමට බැඳේ.	ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් සෑම බෙදාහැරීමක් කල යුතුය.
වාර්ෂික වාර්තාව සමඟ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.	වාර්ෂික වාර්තාව සමඟ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
නාමය දැක්වීමේදී පෞද්ගලික (ඡඩඪ) ලෙස යෙදිය යුතුය.	ලැයිස්තුගත සමාගමක් නම් පොදු (ඡමඉකසජ) යන්න යෙදිය යුතු අතර ලැයිස්තුගත නොවේ නම් අවශ්‍ය නොවේ.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් සහ උපරිමය 50 කි.	සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් හා උපරිමය සීමාවක් නොවේ.

සීමිත පෞද්ගලික සමාගමක් යනු,

සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් සහ උපරිමය සීමාවක් නොවන කොටස් හෝ සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට බලයක් නොමැති සමාගම්ය.

සීමිත පොදු සමාගමක් යනු,

සාමාජික සංඛ්‍යාව අවමය 1 ක් සහ උපරිමය සීමාවක් නොවන කොටස් හෝ සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට බලයක් හිමි සමාගම් සීමිත පොදු සමාගම් ලෙස හඳුන්වයි.

සමාගමක කොටස්

සමාගමක ප්‍රධාන අරමුදල් සම්පාදන මාර්ගය කොටස් නිකුත් කිරීම වේ. කොටසක් යනු "සමාගමක ප්‍රාග්ධනය මනිනු ලබන ප්‍රමාණාත්මක මිනුමයි. "එනම් සමාගමක ප්‍රාග්ධන ඒකකය කොටසක් ලෙස හඳුන්වයි. පෞද්ගලික සමාගම් ප්‍රසිද්ධියේ කොටස් නිකුත් නොකරන අතර පොදු සමාගම් මහජනතාවට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කරයි.

කොටස් වෙනුවෙන් සමාගම් ලාභාංශ ගෙවන අතර සමාගම ඈවර කිරීමක දී කොටස් මුදල් ආපසු ගෙවයි. ලාභාංශ ගෙවීම සමාගමේ ලාභ ඇතොත් පමණක් සිදු කරයි. එබැවින් අවදානම් බව අඩු ප්‍රාග්ධන සම්පාදනය කොටස් බැවින් ප්‍රාග්ධන සම්පාදනය වඩා යෝග්‍ය මාර්ගය කොටස් නිකුතුව වශයෙන් සමාගම් තෝරාගනී.

ප්‍රකාශකළ ප්‍රාග්ධනය / ප්‍රකාශිත ප්‍රාග්ධනය (Stated Capital)

සමාගමක් අරමුදල් සම්පාදනය සඳහා නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය ප්‍රකාශිත ප්‍රාග්ධය ලෙස හඳුන්වයි. සමාගම් පනතේ 58 වන වගන්තිය අනුව ප්‍රකාශිත ප්‍රාග්ධනය යනු නිකුත් කළ කොටස් වෙනුවෙන් සහ කොටස් වෙනුවෙන් මෙතෙක් කළ ඇරයුම් වෙනුවෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු මුදල්වල එකතුවයි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස සමාගමක් පෙන්වනු ලබන්නේ කොටස් මුදල් වලින් සමාගම ඇරයුම් කර ඇති ප්‍රමාණයයි.

සමාගමක් කොටසකට රු. 25 ක ප්‍රතිෂ්ඨාවකට කොටස් 10,000 කට රු. 15 ක් ඇරයුම් කර ඇති විට ප්‍රකාශිත ප්‍රාග්ධනය වනුයේ,

$$10,000 \times 15 = \underline{\underline{150,000}}$$

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කොටස් අධිමිල අවමිල හඳුනා ගැනීමක් වර්තමාන සමාගම් පනතේ සිදු නොවේ. කොටසක නාමික අගය, අනුදත් කොටස්, ප්‍රාග්ධනය, යන යෙදුම් භාවිතයෙන් ඉවත් වේ. වර්තමාන පනතේ නාමික අගයන්, අධිමිල යන සියලුම දෑ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස හඳුනාගනී

කොටස් වර්ග (Types of Shares)

සමාගමකට විවිධ වර්ගවල කොටස් නිකුත් කළ හැකි අතර ඒවා,



නව සමාගම් පනත අනුව සමාගමක් මහජනතාවට නිකුත් කරන කොටසකට අදාළ නාමික මිල (සම මිල) ක් හඳුනාගත නොහැක. එනම් නව පනත අනුව කොටසක ලියාපදිංචිගත වටිනාකමක් නොමැති බවයි. මේ නිසා කොටසක වටිනාකම ලෙස හඳුනාගනු ලබන්නේ අදාළ අවස්ථාවේ කොටසක නිකුතු වටිනාකමයි. මෙම කොටසක නිකුතු මිල තීරණය කිරීමේ බලය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී.

52 වගන්තිය ප්‍රකාරව, සමාගමක් කොටස් නිකුත් කිරීමට පෙර එහි අධ්‍යක්ෂ මණ්ඩලය

I. කොටසක් නිකුත් කරන්නේ කිනම් (අගයකටද) ප්‍රතිෂ්ඨාවකටද ;කදබිසාැර්එසදබ* යන්න තීරණය කිරීම, සහ

II. එම ප්‍රතිෂ්ඨාව සමාගමේ දැනට සිටින කොටස්හිමියන්ට මෙන්ම සමාගමට සාධාරණ හා යුක්තිසහගත අගයක් බවට තහවුරු කළ යුතු වේ.

මෙම නිකුත් කරන කොටස් මුදලට, පොරොන්දු නෝට්ටු, අනාගත සේවා සඳහා, ඕනෑම දේපළක් සඳහා හෝ වෙනත් සුරැකුම්පතක් වෙනුවෙන් සිදුකළ හැකි අතර ප්‍රතිෂ්ඨාව ලැබ දින 20 ක් තුළ විභාජනය කිරීම සිදුකළ යුතු වේ.

නව සමාගම් පනතට අනුව පවතින්නේ "ප්‍රකාශිත ප්‍රාග්ධනයක් ";ඒඑැ ක්වසඒක* පමණි. (58 වගන්තිය) එනම්,

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

a. නිකුත් කළ කොටස් වෙනුවෙන් සහ

b. කොටස් සඳහා වන ඇරයුම් සඳහා

සමාගමට ලැබුණු මුදල හෝ ලැබිය යුතු මුදලේ එකතුවයි.

1. ස්කන්ධ / සාමාන්‍ය කොටස් (Ordinary Share / Equity Share)

සමාගමක පරිපාලන බලතල හිමි අයිතිකරුවන් ලෙස සැලකෙන කොටස්කරුවන්ට හිමි කොටස් "සාමාන්‍ය කොටස්" ලෙස හඳුන්වයි.

සාමාන්‍ය කොටස්වල ලක්ෂණ

1. පාලන බලතල හිමිවීම.
2. කොටස් ප්‍රමාණයට සමානව ඡන්ද බලය හිමිවීම.
3. වරණීය කොටස්වල මෙන් ලාභාංශ නිශ්චිත නොවීම.
4. වරණීය කොටස්වල ලාභාංශ වලට පසු ලාභාංශ හිමිවීම.
5. අධ්‍යක්ෂකවරුන්ගේ තීරණ මත පමණක් ලාභාංශ ලැබීම.

2. වරණීය කොටස් (Preference Shares)

ලාභාංශ නිශ්චිත පාලන බලතල හිමි නොවන කොටස් "වරණීය කොටස්" ලෙස හඳුන්වයි.

වරණීය කොටස්වල ලක්ෂණ

1. පාලන බලතල හිමි නොවීම.
2. ලාභාංශ නිශ්චිත වීම.
3. ලාභාංශ ලැබීමේදී ප්‍රමුඛතාව ලැබීම.
4. සමාගම ඈවර කිරීමේදී ප්‍රමුඛතාව ලැබීම.
5. ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස හඳුනා නොගැනීම.

වරණීය කොටස් පැවැතිය හැකි අනුස්වරූප කිහිපයකි

(අ) සමුච්චිත වරණීය කොටස් (Cumulative Preference Shares)

කිසියම් කාලපරිච්ඡේදයක ලාභාංශ නොගෙවූයේ නම් එම පෙර වර්ෂවල ලාභාංශ ප්‍රවර්තන වර්ෂ වල ලැබිය හැකි වරණීය කොටස් සමුච්චිත වරණීය කොටස් ලෙස හඳුන්වයි. එනම් හිඟ ලාභාංශද ලැබිය හැකි වරණීය කොටස් සමුච්චිත වරණීය කොටස් වේ. සාමාන්‍ය වරණීය කොටස් සමුච්චිත වරණීය කොටස් වන අතර අභ්‍යාස වලදී ''සමුච්චිත" ලෙස දක්වා ඇත්නම් පමණක් සමුච්චිත වරණීය කොටස් ලෙස සලකයි.

(ආ) අසමුච්චිත වරණීය කොටස් (Non Cumulative Preference Shares)

පෙර වර්ෂවල හිඟ ලාභාංශ ලැබීමට හිමිකම් නොමැති වරණීය කොටස් අසමුච්චිත වරණීය කොටස් ලෙස හඳුන්වයි. සමාගම් සම්බන්ධව විරල වශයෙන් හඳුනා ගත හැක.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

(ඇ) සහභාගී වරණීය කොටස් (Participative Preference Shares)

සාමාන්‍ය කොටස්කරුවන් ලාභාංශ ගෙවූ පසු ඉතිරිවන අතිරික්ත ලාභාංශ වලටද හිමිකම් කිව හැකි වරණීය කොටස් සහභාගී වරණීය කොටස් ලෙස හඳුන්වයි. මෙම කොටස් සඳහා සාමාන්‍ය වරණීය ලාභාංශ ලැබෙන අතර අතිරික්තව අතිරික්ත ලාභාංශ සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ පසුව ලැබේ.

(ඉ) නිදහස් කළ හැකි වරණීය කොටස් (Redeemable Preference Shares)

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධාන වලට අනුව යම්කිසි කාලයකට පසු හෝ නිශ්චිත කාල පරාසයක් තුළ නිදහස් කිරීම් හැකියාව සහිත වරණීය කොටස් නිදහස් කළ හැකි වරණීය කොටස් ලෙස හඳුන්වයි. සමාගම් අරමුදල් සම්පාදනයට ප්‍රායෝගිකව බහුලව භාවිතා කරයි.

(උ) නිදහස් කළ නොහැකි වරණීය කොටස් (Non Redeemable Preference Shares)

කිසියම් කාල සීමාවක් තුළ නිදහස් කළ නොහැකි සමාගම ඈවර කිරීමේදී නිදහස් කරනු ලබන වරණීය කොටස් නිදහස් කළ නොහැකි වරණීය කොටස් ලෙස හඳුන්වයි

(ඌ)පරිවර්ත්‍යය වරණීය කොටස් (Convertible Preference Shares)

නිශ්චිත කාලයකදී සාමාන්‍ය හෝ වෙනත් කොටස් වර්ගයක් සඳහා පත්කිරීම් හැකියාවක් සහිත වරණීය කොටස් පරිවර්ත්‍යය වරණීය කොටස් ලෙස හඳුන්වයි.

3. **විශේෂ කොටස් (Special Shares)**

I. ආදිකර්තෘ හෙවත් ප්‍රවර්තකයින්ට හිමි කොටස් (Promoters Shares)
II. විලම්භිත කොටස් (ඡන්ද බලය සහිත කොටස්) (Deffered Shares)
III. ස්වර්ණමය/ රන් කොටස් (Golden Shares) (රාජ්‍ය සමාගම් භාණ්ඩාගාරය නමින් නිකුත් කරන කොටස්)

මෙම කොටස් වර්ග පිළිබඳ තොරතුරු සාංගමික ව්‍යවස්ථාවලියේ පැහැදිලි ලෙස සඳහන් කර පැවතිය යුතුය.

කොටස් නිකුත් කිරීම (Issue of Shares)

සංස්ථා ප්‍රකාශය (Prospectus)

සමාගමක් කොටස් හෝ ණයකර සඳහා සහභාගී වීමට නැතහොත් ඒවා මිලදී ගැනීමට මහජනතාව වෙත යෝජනා කෙරෙන දැන්වීමක්, චක්‍රලේඛයන්ගේ හෝ ප්‍රචාරක දැන්වීමකි.

සමාගමක් සංස්ථාපනය කළ වහාම ලියාපදිංචි අයදුම්පතෙහි නම් සඳහන් කර ඇති පුද්ගලයින්ට ලැබීමට ඇති කොටස් නිකුත් කිරීම කළ යුතුය. මෙම කොටස් ආරම්භක කොටස් :ෂබසඑස්ක්"ය්රි* ලෙස හඳුන්වයි. (50 වගන්තිය)

සමාගමක් කොටස් නිකුත් කර දින 20 ක් ඇතුලතදී සමාගම් රෙජිස්ටාර්වරයා වෙත පහත තොරතුරු දැනුම් දිය යුතුය.

i. නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව
ii. කොටස් නිකුත් කරන ලද ප්‍රතිෂ්ඨාව
iii. කොටස් නිකුත් කළ පසු ප්‍රකාශ කළ ප්‍රාග්ධනය.

JMC vLearning
"your virtual learning partner"

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කොටස් මත ඇරයුමක් කළ විට වැඩ කරන දින 10 ක තුළ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට පහත කරුණු සම්බන්ධව සමාගම විසින් දැනුවත් කළ යුතුය.

I. ඇරයුම් ප්‍රමාණය හෝ එහි වටිනාකම

II. ඇරයුම් කළ පසු ප්‍රකාශ කළ ප්‍රාග්ධනය

අවම සහභාගී මුදල (Minimum Subscription)

කොටස් නිකුතුව මගින් සමාගම රැස්කර ගැනීමට අපේක්ෂිත අරමුදල් ප්‍රමාණය අවම සහභාග මුදල ලෙස හඳුන්වයි.

අවම සහභාග මුදල සපුරාගත නොහැකි නම් කොටස් විභාජනය (බෙදා හැරීම) නොකළ යුතු අතර ලැබූ මුදල් ආපසු යැවිය යුතුය.

කොටස් ප්‍රාරක්ෂණය (Share Underwriting)

සමාගමක කොටස් නිකුතුවකදී අවම සහභාගී මුදලට ප්‍රමාණවත් කොටස් අලෙවියක් සිදු නොවන විට අලෙවි නොවූ කොටස් මිලදී ගැනීම පිළිබඳ සමාගම රක්ෂණ ආයතනයක් සමඟ ඇතිකර ගන්නා එකඟතාව ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

කොටසක නිකුතු අගය (Issue Value of a Share)

සමාගමක් කොටස් නිකුත් කිරීමට පෙර එහි අධ්‍යක්ෂක මණ්ඩලය පහත දෑ අවදානයට ලක් කළ යුතුය.

I. කොටස් නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ කුමන ප්‍රතිෂ්ඨාවක් යටතේද යන්න.
II. එම ප්‍රතිෂ්ඨාව සමාගමට හා දැනට සිටින සියලුම කොටස්කරුවන්ට යුක්ති සහගත සාධාරණ අගයක් ද යන්න.

කොටස් නිකුතුව මුදල්, පොරොන්දු නෝට්ටු, අනාගත සේවා, දෝෂ හෝ වෙනත් සුරැකුම් වෙනුවෙන් නිකුත් කළ හැක. කුමන ආකාරයට ප්‍රතිෂ්ඨාව ලැබුවද ප්‍රතිෂ්ඨාව ලැබී දින 20 තුළ කොටස් විභාජනය කළ යුතුය. (52 වන වගන්තිය)

අධි දායකත්වය සහ ඌන දායකත්වය

සමාගමක කොටස් නිකුත් කිරීමකදී සමාගම නිකුත් කරන කොටස් ප්‍රමාණය සඳහාම ආයෝජකයින් අයදුම් පත්‍ර යොමු කිරීම ප්‍රායෝගිකව සිදු නොවිය හැක. එහිදී නිකුත් කරන කොටස් ප්‍රමාණයට වඩා වැඩිපුර අයදුම් පත්‍ර ලැබී ඇති අවස්ථාව අධි දායකත්වය ලෙසද අඩුවෙන් අයදුම්පත්‍ර ලැබී තිබීම ඌන දායකත්වය ලෙසද හඳුන්වයි.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිලදී ගැනීමේදී දැනගත යුතු කරුණු

ප්‍රාථමික වෙළෙඳපොළින් කොටස් මිල දී ගැනීමේ දී ආයෝජකයකු අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු කරුණු කිහිපයක් මෙසේ පෙළගැස්විය හැකිය.



• ආයෝජකයකු විසින් සංස්ථා ප්‍රකාශය (Prospectus) කියවා තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

පසුගිය කාලයේ දී ශ්‍රී ලංකාවේ සිදු කළ කොටස් නිකුත් කිරීම් සියල්ලටම පාහේ ඉතා විශාල මහජන උනන්දුවක් ඇති විය. එහෙත් බොහෝ ආයෝජකයන් මෙසේ කොටස් නිකුත් කළ සමාගම් ප්‍රකාශයට පත් කළ සංස්ථා ප්‍රකාශය පරිහරණය කර/කියවා නොතිබුණි. සංස්ථා ප්‍රකාශය නිවැරැදිව කියවා හෝ අන් අයෙක් මගින් (උදාහරණයක් වශයෙන් තැරැව්කාර ආයතනයක් මගින්) ඒ පළිබඳව අවබෝධයක් ලබාගත් අය සිටියේ ඉතාම අඩු වශයෙනි. සමහර සමාගම් නිකුත් කළ සංස්ථා ප්‍රකාශවල ඔවුන් තම කොටස් බෙදා හරින්නේ කෙසේ දැයි පැහැදිලිව සඳහන් කර තිබූ අතර (උදාහරණයක් වශයෙන් තම සේවකයන්ට හා සේවාදායකයන්ට කොටස් නිකුත් කිරීමේ දී ප්‍රමුඛත්වය දක්වන බව සමහර සංස්ථා ප්‍රකාශවල පැහැදිලිව සඳහන් කර තිබුණි). මෙය තේරුම් නොගත් සමහර ආයෝජකයන් ඒ පිළිබඳව නිකරුණේ කොටස් වෙළෙඳපොළට සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැමිණිලි කළ අවස්ථා තිබුණි.

සමාගම් විසින් කොටස් නිකුත් කිරීමේ දී අනුගමනය කරන පියවර ඇතුළු සියලු විස්තර සංස්ථා ප්‍රකාශයේ සඳහන් වන බැවින් කොටස් මිල දී ගැනීමට අයදුම් කිරීමට ප්‍රථමව සංස්ථා ප්‍රකාශය කියවා අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

• සමාගම විසින් සිදු කරනු ලබන්නේ "කොටස් මිලයට ගැනීමට ආරාධනාවක්" ආයෝජකයන් වෙත කිරීමකි.

ප්‍රාථමික කොටස් වෙළෙඳපොළෙන් කොටස් නිකුත් කිරීමක දී සමාගම විසින් මහජනයා වෙත තම සමාගමේ කොටස් මිල දී ගන්නා ලෙස ආරාධනය කරයි (It is an Offer). සමාගමේ කොටස් මිලයට ගැනීම හෝ නොගැනීම ආයෝජකයා සතු අයිතියකි. සමාගම තම කොටස් මිලයට ගන්නා ලෙස ආයෝජකයන්ට බලපෑමක් නොකරයි. සමාගමේ සංස්ථා ප්‍රකාශය කියවා බලා සමාගම පිළිබඳව සහ එහි අනාගත සැලසුම් පිළිබඳව ආයෝජකයා සෑහීමකට පත් වන්නේ නම් පමණක් කොටස් මිලයට ගැනීම සඳහා අයදුම් කළ හැක. එසේ සෑහීමකට පත් වන්නේ නැත්නම් කොටස් මිලයට ගැනීම සඳහා ආයෝජකයාට අයදුම් නොකර සිටිය හැක.

• ප්‍රාථමික වෙළෙඳපොළ හරහා කොටස් නිකුත් කිරීමක දී කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ සමාගමයි.

ප්‍රාථමික වෙළෙඳපොළ හරහා කොටස් නිකුත් කිරීමක දී සමාගමක් තමන්ගේ කොටසක් මහජනයා හට නිකුත් කරන්නේ කුමන මිලයකට දැයි තීරණය කරනු ලබයි. එනම් කොටස් නිකුතුවක දී කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමයි. එහි දී එම සමාගම් බොහෝ විට කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමේ කොටසක ශුද්ධ වත්කම් අගය (Net Asset Value) පදනම් කර ගෙනය. එහි දී සමාගම විසින් ශුද්ධ වත්කම් අගයට අමතරව සමාගමේ ඉදිරි මුල්‍ය ප්‍රවාහයන් සැලකිල්ලට ගනු ලැබේ. සමහර අවස්ථාවල දී සමාගමේ කීර්ති නාමය ද කොටසක් නිකුත් කරන මිල තීරණය කිරීමට බලපායි.

මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෝ කොටස් වෙළෙඳපොළ සමාගමක කොටසක නිකුත් කරන මිල තීරණය කිරීමට සම්බන්ධ නොවන බවයි. එය සමාගමේ කාර්යභාරයකි. යම්කිසි අවස්ථාවක සමාගම කොටස් නිකුත් කිරීමක දී එහි කොටසක ශුද්ධ වත්කම් අගයට වඩා ඉතා ඉහළ මිලකට කොටස් නිකුත් කරන්නේ නම් එම අවදානම දරන්නේ ද එම සමාගමයි. මක් නිසාද යත් ආයෝජකයා විසින් කොටසක ශුද්ධ වත්කම් අගය සහ කොටසක් නිකුත් කරන මිල සසඳා බලා එම කොටස් සඳහා අයදුම් නොකර සිටීමට තීරණය කළ හැකි බැවිනි. එවිට සමාගමට තම කොටස් නිකුත් කිරීමේ දී එම මුළු කොටස් ප්‍රමාණයම මහජනයා හට නිකුත් කර ගැනීමට නොහැකි වනු ඇත. ඒ හේතුවෙන් කොටස් නිකුත් කිරීමෙන් රැස් කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුදල් රැස් කර ගත නොහැකි වනු ඇත. ආයෝජකයකුට සමාගමේ කොටසක ශුද්ධ වත්කම් අගය එහි සංස්ථා ප්‍රකාශයෙන් දැනගත හැක. ඉහතින් සඳහන් කළ ආකාරයට සංස්ථා ප්‍රකාශය පැහැදිලිව කියවීමෙන් මෙම කරුණු අවබෝධ කරගත යුතුය.

• සමාගමේ කොටස් අයිතිකාරත්වය වෙනස් වී ඇති ආකාරය අධ්‍යයනය කළ යුතුය.

කොටස් නිකුතුවක් තුළින් කොටස්වලට අයදුම් කිරීමේ දී ආයෝජකයකු විසින් එම සමාගමේ කොටස් ව්‍යුහයට සිදු වී ඇති වෙනස්කම් (Changes to the Shareholding Structure) අවබෝධ කරගත යුතු වේ. එනම් සමාගම විසින් මහජන කොටස් නිකුතුවට පෙර පෞද්ගලික කොටස් නිකුතුවක් මගින් කොටස් නිකුත් කර ඇත් ද එසේ නම් එම කොටසක් නිකුත් කළ මිල කොපමණ ද යන කාරණා පිළිබඳව සොයා බැලීම අත්‍යාවශ්‍ය වේ.



මෙම සියලුම කාරණා ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් වේ. එනමුත් සමහර ආයෝජකයන් මෙම කරුණු හරිහැටි කියවා නොබලා සහ අවබෝධ කර නොගෙන බොහෝ අවස්ථාවල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට පැමිණිලි කරති. මෙහි දී නැවත සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සංස්ථා ප්‍රකාශයේ සියලුම කරුණු ඇතුළත් වන අතර එම කරුණු පිළිබඳව ආයෝජකයා සෑහීමකට පත් වන්නේ නැත්නම් කොටස්වලට අයදුම් නොකර සිටීමේ පූර්ණ අයිතිය ආයෝජකයා සතු වන බවයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මෙම වසරේ අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි නියාමනයක් පැනවූ අතර එයට අනුව කිසියම් පොදු සමාගමක කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමට වසරකට පෙර කිසියම් පුද්ගලයකුට වෙන් කර දී ඇත්නම් එම කොටස් එවැනි වෙන් කිරීමක් කරන ලද දිනයේ සිට වසරක කාලයක් යන තුරු ගනුදෙනු කළ නොහැකි බවට නියෝගයක් නිකුත් කරන ලදී.

• සමාගම කොටස් නිකුත් කිරීමෙන් රැස් කර ගනු ලබන අරමුදල් යොදවන්නේ කුමන කටයුත්තක් සඳහා ද යන්න ආයෝජකයා අවබෝධ කර ගත යුතු වේ.

• සමාගමේ විගණන ආයතනය විසින් පළ කර ඇති විගණන වාර්තාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ද ආයෝජකයා සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම ස්වාධීන විගණන වාර්තාව ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව දැක්වේ.

• ආයෝජකයකුට ඉල්ලුම් කළ යුතු අවම කොටස් ප්‍රමාණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ද ඉතා වැදගත් වේ.

• යම් හෙයකින් නිකුත් කරන මුළු කොටස් ප්‍රමාණයම සඳහා ආයෝජකයන් විසින් අයදුම් නොකළහොත් ඉතිරි වන කොටස් ප්‍රමාණය සඳහා ප්‍රාරක්ෂකයකු (Underwriter) සිටිනවා ද යන වග.

ප්‍රාරක්ෂකයකු යනු සමාගමක් විසින් කොටස් නිකුත් කිරීමක දී යම් හෙයකින් ආයෝජකයන් විසින් මුළු නිකුත් කොටස් ප්‍රමාණයම සඳහා අයදුම් නොකළහොත්, එසේ අයදුම් නොකර ඉතිරි වන කොටස් ප්‍රමාණය මිලට ගන්නා ආයතනයයි. මේ සඳහා කොටස් නිකුත් කිරීමට ප්‍රථමව කොටස් නිකුත් කරන සමාගම සහ ප්‍රාරක්ෂක ආයතනය ගිවිසුමකට එළඹේ.

• මෙම කාරණාවලට අමතරව සමාගමේ ඉදිරි සැලසුම්, සමාගමේ ප්‍රධාන කොටස් හිමියන් පිළිබඳ විස්තර, සමාගම යම්කිසි ව්‍යාපාරික ආරවුලකට හෝ නීතිමය වශයෙන් වෙනත් ආරවුලකට මැදි වී සිටිනවා ද යන වග, සමාගමේ කළමනාකාරිත්වය, සමාගම ව්‍යාපාරික කටයුතු කරන ක්ෂේත්‍රයේ ඔවුනගේ ක්‍රියාකාරිත්වය සහ ස්ථානය, ලාභාංශ ගෙවීමේ ප්‍රතිපත්තිය, සමාගම ඉදිරි සැලසුම් සඳහා දරණ ව්‍යාපාරික අවදානම, සමාගම තම ව්‍යාපාරික කටයුතුවල දී ප්‍රධාන සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් මත යැපෙන ප්‍රමාණය, සමාගමේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් කවුරුන් ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

• වර්තමානයේ සමහර ආයෝජකයන් ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිල දී ගැනීමේ දී බලාපොරොත්තු වන්නේ එම කොටස්. කොළඹ කොටස් වෙළෙඳපොළේ ගනුදෙනු ආරම්භ වූ මුල් දිනය තුළම 100%ක ලාභයක් ඇතිව විකුණා ගැනීමයි. පසුගිය වසර කිහිපය තුළ ප්‍රාථමික නිකුතුන් සිදු කළ සමහර සමාගම්වල කොටස් මිල ගණන් එහි කොටස් ගනුදෙනු ආරම්භ වූ මුල් දිනම 100%කින් පමණ ඉහළ නැගුණ අතර මේ හේතුවෙන් සෑම සමාගමකම කොටස් මිල විශාල වශයෙන් ඉහළ යනු ඇතැයි ආයෝජකයන් බලාපොරොත්තු වේ.

එහෙත් මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය යනු දිගුකාලීන ආයෝජන මාර්ගයක් වන අතර සමහර සමාගම්වල මිල ගණන් කෙටිකාලීනව ඉහළ නොගොස් දිගුකාලීනව ඉහළ යා හැකි බවයි. එමෙන්ම සමහර අවස්ථාවල දී කොටස් මිල පහළ වැටීමට ද ඉඩ ඇත. ඔබ දිගුකාලීන බලාපොරොත්තුවෙන් ආයෝජනය කළ හොත් ඔබ හට කොටස් මිල පහළ වැටුණු අවස්ථාවක දී එම කොටස් නොවිකුණා කොටස් මිල ඉහළ නැගෙන තුරු සිටීමට හැක. ඔබ ගනුදෙනු ආරම්භ වූ මුල් දිනම ඉතා ඉහළ ලාභයක් බලාපොරොත්තුවෙන් කොටස් විකිණීම පිණිස ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිල දී ගෙන තිබුණහොත් යම් හෙයකින් ගනුදෙනු ආරම්භ වූ මුල් දින කිහිපය තුළ කොටස් මිල පහළ වැටුණහොත්, ඔබ කොටස් මිල දී ගෙන තිබුණේ "හදිසියකට අවශ්‍ය මුදල්" යොදවා නම් එයින් ඔබ ගැටලුවකට මැදි වේ. ඔබ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කළ යුත්තේ ඔබ හට "හදිසියකට අවශ්‍ය මුදල්" නොවන අතර ඔබගේ ඉතුරුම්වලින් යම් ප්‍රතිශතයකි.

ඉහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා සංකීර්ණ කටයුත්තක් බව සමහර අයට පෙනී යා හැකිය. එහෙත් එය අපහසු දෙයක් නොවන අතර ඒ සඳහා අවශ්‍ය නම් තම තැරැව්කාර සමාගමේ උපදෙස් ලබාගෙන සිදු කිරීමට ද හැකියාව ඇත.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ප්‍රාථමික වෙළඳපලෙන් කොටස් මිලදී ගැනීමේදී දැනගත යුතු කරුණු

ප්‍රාථමික වෙළඳපලෙන් කොටස් මිලදී ගැනීමේදී ආයෝජකයකු අත්‍යාවශ්‍යයෙන්ම දැනගත යුතු කරුණු කිහිපයක් මෙසේ පෙළගැස්විය හැකිය.

- ආයෝජකයකු විසින් සංස්ථා ප්‍රකාශය (Prospectus) කියවා තේරුම් ගැනීම අත්‍යාවශ්‍ය වේ.

පසුගිය කාලයේදී ශ්‍රී ලංකාවේ සිදුකළ කොටස් නිකුත් කිරීම් සියල්ලමට පාහේ ඉතා විශාල මහජන උනන්දුවක් ඇති විය. එහෙත් බොහෝ ආයෝජකයන් මෙසේ කොටස් නිකුත් කළ සමාගම් ප්‍රකාශයට පත් කළ සංස්ථා ප්‍රකාශය පරිහරණය කර / කියවා නොතිබුණි. සංස්ථා ප්‍රකාශය නිවැරදිව කියවා හෝ අන් අයෙක් මගින් (උදාහරණයක් වශයෙන් තැරැව්කාර ආයතනයක් මගින්) ඒ පිළිබඳව අවබෝධයක් ලබාගත් අය සිටියේ ඉතාම අඩු වශයෙනි. සමහර සමාගම් නිකුත් කළ සංස්ථා ප්‍රකාශවල ඔවුන් තම කොටස් බෙදාහරින්නේ කෙසේදැයි පැහැදිලිව සඳහන් කර තිබූ අතර (උදාහරණයක් වශයෙන් තම සේවකයින්ට හා සේවාදායකයන්ට කොටස් නිකුත් කිරීමේදී ප්‍රමුඛත්වය දක්වන බව සමහර සංස්ථා ප්‍රකාශවල පැහැදිලිව සඳහන් කර තිබුණි). මෙය තේරුම් නොගත් සමහර ආයෝජකයන් ඒ පිළිබඳව නිකරුණේ කොටස් වෙළඳපොලට සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැමිණිලි කළ අවස්ථා තිබුණි.

සමාගම් විසින් කොටස් නිකුත් කිරීමේදී අනුගමනය කරන පියවර ඇතුළු සියළු විස්තර සංස්ථා ප්‍රකාශයේ සඳහන් වන බැවින් කොටස් මිලදී ගැනීමට අයදුම් කිරීමට ප්‍රථමව සංස්ථා ප්‍රකාශය කියවා අවබෝධයක් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

- සමාගම විසින් සිදුකරනු ලබන්නේ ''කොටස් මිලයට ගැනීමට ආරාධනාවක්'' ආයෝජකයන් වෙත කිරීමකි.

ප්‍රාථමික කොටස් වෙළඳපලෙන් කොටස් නිකුත් කිරීමකදී සමාගම විසින් මහජනයා වෙත තම සමාගමේ කොටස් මිලදී ගන්නා ලෙස ආරාධනා කරයි (ෂඑ සි"බ දගෙර). සමාගමේ කොටස් මිලයට ගැනීම හෝ නොගැනීම ආයෝජකයා සතු අයිතියකි. සමාගම තම කොටස් මිලයට ගන්නා ලෙස ආයෝජකයන්ට බලපෑමක් නොකරයි. සමාගමේ සංස්ථා ප්‍රකාශය කියවා බලා සමාගම පිළිබඳව සහ එහි අනාගත සැලසුම් පිළිබඳව ආයෝජකයා සෑහීමකට පත් වන්නේ නම් පමණක් කොටස් මිලයට ගැනීම සඳහා අයදුම් කළ හැක. එසේ සෑහීමකට පත්වන්නේ නැත්නම් කොටස් මිලයට ගැනීම සඳහා ආයෝජකයාට අයදුම් නොකර සිටිය හැක.

- ප්‍රාථමික වෙළඳපොල හරහා කොටස් නිකුත් කිරීමකදී කොටස් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ සමාගමයි.

ප්‍රාථමික වෙළඳපොල හරහා කොටස් නිකුත් කිරීමකදී සමාගමක් තමන්ගේ කොටසක් මහජනයා හට නිකුත් කරන්නේ කුමන මිලයකට දැයි තීරණය කරනු ලබයි. එනම් කොටස් නිකුතුවකදී කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමයි. එහිදී එම සමාගම් බොහෝ විට කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමේ කොටසක ශුද්ධ වත්කම් අගය (හැඒ"ැඑ ඪකමැ) පදනම් කරගෙනය. එහිදී සමාගම විසින් ශුද්ධ වත්කම් අගයට අමතරව සමාගමේ ඉදිරි මූල්‍ය ප්‍රවාහයන් සැලකිල්ලට ගනු ලැබේ. සමහර අවස්ථාවලදී සමාගමේ කීර්ති නාමය ද කොටස් නිකුත් කරන මිල තීරණය කිරීමට බලපායි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෝ කොටස් වෙළඳපොල සමාගමක කොටසක් නිකුත් කරන මිල තීරණය කිරීමට සම්බන්ධ නොවන බවයි. එය සමාගමේ කාර්යභාරයකි. යම්කිසි අවස්ථාවක සමාගම කොටස් නිකුත් කිරීමකදී එහි කොටසක ශුද්ධ වත්කම් අගයට වඩා ඉතා ඉහළ මිලකට කොටස්

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

නිකුත් කරන්නේ නම් එම අවදානම දරන්නේ ද එම සමාගමයි. මක්නිසාද යත් ආයෝජකයා විසින් කොටසක ශුද්ධ වත්කම් අගය සහ කොටස් නිකුත් කරන මිල සසඳා බලා එම කොටස් සඳහා අයදුම් නොකර සිටීමට තීරණය කළ හැකි බැවිනි. එවිට සමාගමට තම කොටස් නිකුත් කිරීමේදී එම මුළු කොටස් ප්‍රමාණයම මහජනයා හට නිකුත් කර ගැනීමට නොහැකි වනු ඇත. ඒ හේතුවෙන් කොටස් නිකුත් කිරීමෙන් රැස්කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුදල් රැස්කර ගත නොහැකි වනු ඇත. ආයෝජකයකුට සමාගමේ කොටසක ශුද්ධ වත්කම් අගය එහි සංස්ථා ප්‍රකාශයෙන් දැනගත හැක. ඉහතින් සඳහන් කළ ආකාරයට සංස්ථා ප්‍රකාශය පැහැදිලිව කියවීමෙන් මෙම කරුණු අවබෝධ කරගත යුතුය.

- සමාගමේ කොටස් අයිතිකාරත්වය වෙනස් වී ඇති ආකාරය අධ්‍යයනය කළ යුතුය.

  කොටස් නිකුතුවක් තුළින් කොටස්වලට අයදුම් කිරීමේදී ආයෝජකයකු විසින් එම සමාගමේ කොටස් ව්‍යුහයට සිදුවී ඇති වෙනස්කම් (Changes to the Shareholding Structure) අවබෝධ කරගත යුතු වේ. එනම් සමාගම විසින් මහජන කොටස් නිකුතුවට පෙර පෞද්ගලික කොටස් නිකුතුවක් මගින් කොටස් නිකුත් කර ඇත් ද එසේ නම් එම කොටසක් නිකුත් කළ මිල කොපමණ ද යන කාරණා පිළිබඳව සොයා බැලීම අත්‍යාවශ්‍ය වේ.

  මෙම සියලුම කාරණා ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් වේ. එනමුත් සමහර ආයෝජකයන් මෙම කරුණු හරිහැටි කියවා නොබලා සහ අවබෝධ කර නොගෙන බොහෝ අවස්ථාවල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සහ කොළඹ කොටස් වෙළඳපොලට පැමිණිලි කරති. මෙහි දී නැවත සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සංස්ථා ප්‍රකාශයේ සියලුම කරුණු ඇතුලත් වන අතර එම කරුණු පිළිබඳව ආයොජකයා සෑහීමකට පත්වන්නේ නැත්නම් කොටස්වලට අයදුම් නොකර සිටීමේ පූර්ණ අයිතිය ආයේජකයා සතුවන බවයි.

  සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මෙම වසරේ අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි නියාමනයක් පැනවූ අතර එයට අනුව කිසියම් පොදු සමාගමක කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමට වසරකට පෙර කිසියම් පුද්ගලයකුට වෙන්කර දී ඇත්නම් එම කොටස් එවැනි වෙන්කිරීමක් කරන ලද දිනයේ සිට වසරක කාලයක් යන තුරු ගණුදෙනු කළ නොහැකි බවට නියෝගයක් නිකුත් කරන ලදී.

- සමාගම කොටස් නිකුත් කිරීමෙන් රැස්කරගනු ලබන අරමුදල් යොදවන්නේ කුමන කටයුත්තක් සඳහා ද යන්න අයෝජකයා අවබෝධ කර ගත යුතුවේ.

- සමාගමේ විගණන ආයතනය විසින් පළ කර ඇති විගණන වාර්තාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ද අයෝජකයා සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම ස්වාධීන විගණන වාර්තාව ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව දැක්වේ.

- ආයෝජකයකුට ඉල්ලුම් කළ යුතු අවම කොටස් ප්‍රමාණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ද ඉතා වැදගත් වේ.

- යම් හෙයකින් නිකුත් කරන මුළු කොටස් ප්‍රමාණයම සඳහා ආයෝජකයන් විසින් අයදුම් නොකළහොත් ඉතිරි වන කොටස් ප්‍රමාණය සඳහා ප්‍රාරක්ෂකයකු (ඔබැාරඅරසඑැර) සිටිනවා ද යන වග.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ප්‍රාරක්ෂකයකු යනු සමාගමක් විසින් කොටස් නිකුත් කිරීමකදී යම් හෙයකින් ආයෝජකයන් විසින් මුළු නිකුත් කොටස් ප්‍රමාණයම සඳහා අයදුම් කළහොත්, එසේ අයදුම් නොකර ඉතිරි වන කොටස් ප්‍රමාණය මිලට ගන්නා ආයතනයයි. මේ සඳහා කොටස් නිකුත් කිරීමට ප්‍රථමව කොටස් නිකුත් කරන සමාගම සහ ප්‍රාරක්ෂක ආයතනය ගිවිසුමකට එළඹේ.

- මෙම කාරණාවලට අමතරව සමාගමේ ඉදිරි සැලසුම්, සමාගමේ ප්‍රධාන කොටස්හිමියන් පිළිබඳ විස්තර, සමාගම යම්කිසි ව්‍යාපාරික ආරවුලකට හෝ නීතිමය වශයෙන් වෙනත් ආරවුලකට මැදි වී සිටිනවාද යන වග, සමාගමේ කළමනාකාරීත්වය, සමාගම ව්‍යාපාරික කටයුතු කරන ක්ෂේත්‍රයේ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය සහ ස්ථානය, ලාභාංශ ගෙවීමේ ප්‍රතිපත්තිය, සමාගම ඉදිරි සැලසුම් සඳහා දරණ ව්‍යාපාරික අවදානම, සමාගම තම ව්‍යාපාරික කටයුතුවලදී ප්‍රධාන සැපයුම්කරුවන් සහ ගණුදෙනුකරුවන් මත යැපෙන ප්‍රමාණය, සමාගමේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් කවුරුන්ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වැගගත් වේ.

- වර්තමානයේ සමහර ආයෝජකයන් ප්‍රාථමික වෙළඳපොලෙන් කොටස් මිලදී ගැනීමේදී බලාපොරොත්තු වන්නේ එම කොටස්, කෙළඹ කොටස් වෙළඳපොලේ ගණුදෙනු ආරම්භ වූ මුල් දිනය තුළම 100% ක ලාභයක් ඇතිව විකුණා ගැනීමයි. පසුගිය වසර කිහිපය තුළ ප්‍රාථමික නිකුතුන් සිදුකළ සමහර සමාගම්වල කොටස් මිල ගණන් එහි කොටස් ගණුදෙනු ආරම්භ වූ මුල් දිනම 100% කින් පමණ ඉහළ නැගුණ අතර මේ හේතුවෙන් සෑම සමාගමකම කොටස් මිල විශාල වශයෙන් ඉහළ යනු ඇතැයි ආයෝජකයන් බලාපොරොත්තු වේ.

එහෙත් මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ කොටස් වෙළඳපොලේ ආයෝජනය යනු දිගුකාලීන ආයෝජන මාර්ගයක් වන අතර සමහර සමාගම්වල මිල ගනන් කෙටිකාලීනව ඉහළ නොගොස් දිගුකාලීනව ඉහළ යා හැකි බවයි. එමෙන්ම සමහර අවස්ථාවලදී කොටස් මිල පහළ වැටීමට ද ඉඩ ඇත. ඔබ දිගුකාලීන බලාපොරොත්තුවෙන් ආයෝජනය කළහොත් ඔබහට කොටස් මිල පහළ වැටුණු අවස්ථාවකදී එම කොටස් නොවිකුණා කොටස් මිල ඉහළ නැගෙන තුරු සිටීමට හැක. ඔබ ගණුදෙනු ආරම්භ වූ මුල් දිනම ඉතා ඉහළ ලාභයක් බලාපොරොත්තුවෙන් කොටස් විකිණීම පිණිස ප්‍රාථමික වෙළඳපොලෙන් කොටස් මිලදී ගෙන තිබුණහොත් යම් හෙයකින් ගණුදෙනු ආරම්භ වූ මුල් දින කිහිපය තුළ කොටස් මිල පහළ වැටුණහොත්, ඔබ කොටස් මිලදී ගෙන තිබුණේ ''හදිසියකට අවශ්‍ය මුදල්'' යොදවා නම් එයින් ඔබ ගැටලුවකට මැදි වේ. ඔබ කොටස් වෙළඳපොලේ ආයෝජනය කළ යුත්තේ ඔබ හට ''හදිසියකට අවශ්‍ය මුදල්'' නොවන අතර ඔබගේ ඉතුරුම් වලින් යම් ප්‍රතිශතයකි.

ඉහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා සංකීර්ණ කටයුත්තක් බව සමහර අයට පෙනී යා හැකිය. එහෙත් එය අපහසු දෙයක් නොවන අතර ඒ සඳහා අවශ්‍ය නම් තම තැරැව්කාර සමාගමේ උපදෙස් ලබාගෙන සිදු කිරීමට ද හැකියාව ඇත.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කොටස් නිකුත් කිරීම සඳහා ගිණුම්කරණය

(Accounting for Issue of Shares)

සමාගමක කොටස් නිකුත් කිරීමකදී සමාගම් පනතට අනුව කොටස් වලට අදාල මුදල් ලබාගත හැකි ආකාරය මත කොටස් නිකුතුව ප්‍රධාන ආකාර 02 ක් යටතේ හඳුනාගත හැක.

I. කොටසට අදාළ ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගැනීම (Calling of Consideration)
II. කොටසකට අදාළ ප්‍රතිෂ්ඨාව අවස්ථා කිහිපයකදී ලබා ගැනීම (Calling of Consideration in Number of Steps)

නමුත් මින් අවස්ථා කිහිපයකදී අය කිරීම වර්තමානයේ ප්‍රයෝගිකව දැකිය නොහැකි නිසා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම අර්ථාන්විත නොවේ. මේ නිසා එකවර මුදල් අය කරමින් ගිණුම් තැබීම පහත උදාහරණ විසඳීමෙන් අධ්‍යයනය කරමු.

උදාහරණ - 29

සී/ස ජෝන් කීල්ස් සමාගම කොටස් 100,000 නිකුත් කිරීමට සංස්ථා ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කරන ලදී. සංස්ථා ප්‍රකාශයට අනුව කොටසක නිකුතු මිල රු. 28 විය.

අයදුම්පත් පියවන දිනය වනවිට කොටස් 120,000 සඳහා අයදුම්පත් ලැබී තිබුණි. මින් අයදුම්පත් 100,000 තෝරාගෙන ඒ සඳහා කොටස් විභාජනය කොට අතිරික්ත අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලදී.

ඔබ විසින්,

අවශ්‍ය ගිණුම් සටහන් පෙන්වන්න.

උදාහරණ - 30

සී/ස ඩොට් කොම් සමාගම 2019 ජුලි 01 දින සාමාන්‍ය කොටස් 80,000 හා වරණීය කොටස් 50,000 නිකුත් කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කරන ලදී.

කොටසක නිකුතු මිල,

සාමාන්‍ය කොටසක් රු. 25

වරණීය කොටසක් රු. 15

2019 ජුලි 20 අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සාමාන්‍ය කෙටස් 90,000 ක් සඳහාත් වරණීය කොටස් 70,000 ක් සඳහාත් අයදුම්පත් ලැබී තිබුණි. වැඩිපුර ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කොට ඉතිරිය සඳහා කොටස් විභාජනය කරන ලදී.

වරණීය කොටසක් සඳහා රු. 2.50 ක ලාභාංශයක් වාර්ෂිකව හිමිවනු ඇත.

ඔබ විසින්,

කොටස් නිකුතුවට අදාළ ගිණුම් පෙන්වන්න.

සාමාන්‍ය කොටස් නිකුතුවෙන් පසුකාලීනව ක්‍රියාමාර්ග

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

හිමිකම් කොටස් නිකුත් කිරීම (Right Issue)

හිමිකම් කොටස් නිකුත් කිරීම යනු දැනට සිටින සාමාන්‍ය කොටස්හිමියන්ට පවත්නා වෙළඳ මිලට වඩා අඩු මිලකට කොටස් නිකුත් කිරීමයි. එනම් වෙළඳපොලේ පවත්නා මිළට වඩා අඩු මිලක් අය කරමින් ප්‍රවර්තන කොටස් හිමියන්ට සාමාන්‍ය කොටස් නිකුත් කිරීමකි.

උදා: ලෙස රු. 35/- කට වෙළඳ මිල නියමව ඇති සමාගමක් කොටසක් සඳහා රු. 15/-ක් බැගින් අයකරමින් දැනට සිටින කොටස් හිමියන්ට නව කොටස් නිකුතුවක් සිදුකිරීම දැක්විය හැකිය.

1. මෙම හිමිකම් කොටස් නිකුත් කිරීමට අදළ ගිණුම් තැබීම සඳහා ''හිමිකම් කොටස් නිකුත් කිරීමේ ගිණුම'' විවෘත කරන අතර පහත පරිදි ද්විත්ව සටහන් තැබිය යුතුය.

   1. පවරන හිමිකම් කොටස්වල නිකුතු අගය

හිමිකම් කොටස් නිකුත් කිරීමේ ගිණුම	-	හර
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්)	-	බැර

   2. ලැබෙන මුදල

මුදල් පොත	-	හර
හිමිකම් කොටස් නිකුත් කිරීමේ ගිණුම	-	බැර

උදාහරණ - 31

සීමිත චමිල් සහ සමාගමේ 2016.03.31 දිනට පහත ශේෂ පැවතුනි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්)	-	450,000
සංචිත		
පොදු සංචිතය	-	130,000
ලාභ ලාභ ගිණුම	-	85,000

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙදිනට දරණ සෑම සාමන්‍ය කොටස් 9 ටම (4) හතරක් වන පරිදි හිමිකම් කොටස් නිකුත් කිරීමට තීරණය කළ අතර එක් කොටසක් වෙනුවෙන් රු. 12 ක් පමණක් අය කිරීමට තීරණය විය. මෙහි වෙළෙඳ මිල රු 25 කි. දැනට නිකුත් කර ඇති කොටස් ගණන 36,000 කි.

ඔබ විසින්,

අවශ්‍ය ලෙජර් ගිණුම් පෙන්වන්න.

හිමිකම් නිකුතුවක් සිදු කළ පසු කොටසක වෙළඳපළ මිලෙහි පහළ බැසීමක් සිදු විය හැකි අතර එම මිලෙහි සිදුවන පහළ බැසීම හඳුනා ගැනීම සෛද්ධාන්තික පසු හිමිකම් මිල (Theoritical Ex-right Price) ගණනය කිරීමෙන් සිදු කළ හැකිය.

JMC vLearning
"your virtual learning partner"

ප්‍රසාද කොටස් නිකුත් කිරීම (Right Issue)

උදාහරණ - 32

සීමිත යුනිවර්සල් සමූහ සමාගමේ 2016.03.31 දිනට පහත ශේෂ පැවතුනි.

ප්‍රකාශිත ප්‍රග්ධනය

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය - 1,000,000

සංචිත

පොදු සංචිතය - 330,000

ලාභ ලාභ ගිණුම - 185,500

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙදිනට දරණ සෑම සාමන්‍ය කොටස් 4 ටම 1 වන පරිදි ප්‍රසාද කොටස් නිකුත් කිරීමට තීරණය කළ අතර එක් කොටසක් වෙනුවෙන් රු. 14.50 ක් පමණක් අය කිරීමට තීරණය විය.

ඔබ විසින්,

අවශ්‍ය ලෙජර් ගිණුම් හා ජ'නල් සටහන් පෙන්වන්න.

වරණීය කොටස් නිකුත් කිරීම හා නිදහස් කිරීම

සමාගමක් ප්‍රධාන වශයෙන් කොටස් වර්ග කිහිපයක් නිකුත් කරන අතර, එම කොටස් වර්ග මොනවාද? යන්න ඉහත සඳහන් කර ඇත.

- සාමාන්‍ය කොටස් හා
- වරණීය කොටස් ය.

මෙයින් සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් නිකුත් කිරීමට අදාළව ගිණුම් තැබීම හා ඊට අදාළ අනෙකුත් කරුණු මීට පෙර සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.

මෙහිදී නිදහස් කළහැකි වරණීය කොටස් නිකුත් කර ඇත්නම් ඒවා නැවත නිදහස් කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරනු ලබයි. නිදහස් කළ හැකි වරණීය කොටස් නිකුත් කර ඇත්නම් ඒවා නිකුත් කළ අවස්ථාවේ එකඟවූ පරිදි අදාළ දිනයන්හිදී නැවත මුදල් ගෙවා නිදහස් කළ යුතුය. එනම් සමාගම ඈවර කරන තෙක් නොසිට සංස්ථා ප්‍රකාශයේ සඳහන් කළ පරිදි නියමිත දිනවලදී ගෙවා පියවිය යුතුය. එලෙසම නිදහස් කළ හැකි වරණීය කොටස් නිදහස් කරන අවස්ථාවේදී සංස්ථා ප්‍රකාශයේ එකඟ වූ පරිදි අදාළ මිල ගෙවා නිදහස් කිරීම කළ යුතුය. එහිදී නිකුතු මිලට වඩා වැඩි මිලක් ගෙවමින් නිදහස් කිරීමට එකඟ වී ඇත්නම්, එම මිල ද ඒ සමගම ගෙවිය යුතුය.

මෙම වරණීය කොටස් නිදහස් කිරීමේදී ඊට අදාළ ගිණුම් තැබීම සඳහා ''වරණීය කොටස් නිදහස් කිරීමේ ගිණුම'' විවෘත කරන අතර පහත ලෙස ද්විත්ව සටහන් තැබිය යුතුය.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. නිදහස් කරන වරණීය කොටස් වල නිකුතු මිල

ප්‍රකාශිත ප්‍රාග්ධන (වරණීය කොටස්) ගිණුම	-	හර
වරණිය කොටස් නිදහස් කිරීමේ ගිණුම	-	බැර

2. නිදහස් කිරීමට මුදල් ගෙවීම

වරණීය කොටස් නිදහස් කිරීමේ ගිණුම	-	හර
බැංකු ගිණුම	-	බැර

3. නිදහස් කිරීමේදී අධිමිලක් ගෙවිවේ නම්, එය නිදහස් කිරීමේ අලාභයක් ලෙස හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය.

උදාහරණ - 33

සීමිත සවුත් ඒෂියන් ට්‍රැවල්ස් සමාගමේ 2017.03.31 දිනට සකස් කළ ශේෂ පත්‍රයේ පහත දත්ත උපුටා ගන්නා ලදී.

ප්‍රකාශිත ප්‍රාග්ධනය		
<u>නිකුත් කළ</u>	(රු.)	(රු.)
සාමාන්‍ය කොටස්	800,000	
වරණීය කොටස්	<u>250,000</u>	1,050,000
සංචිත		
පොදු සංචිතය		30,000
ලාභාලාභ	<u>125,000</u>	155,000
බැංකු ශේෂය		35,000

මෙම සමාගමේ මෙදිනට පැවති වරණීය කොටස් 12,500 න් 5,000 ක් 10% අධිමිලක් ද සහිතව නිදහස් කිරීමට තීරණය කරන ලදී. ඊට අවශ්‍ය මුදල් රැස්කර ගැනීම සඳහා සාමාන්‍ය කොටස් 10,000 ක් එකක් රු. 18 බැගින් ලබාගෙන නිකුත් කරන ලදී.

අවශ්‍ය ලෙජර් ගිණුම් පෙන්වන්න.

උදාහරණ - 34

සීමිත සෙලින්කෝ ට්‍රැවල්ස් සමාගමේ 2017.03.31 දිනට සකස් කළ ශේෂ පත්‍රයේ පහත තොරතුරු පැවැතුණි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් 750,000

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

නිදහස් කළ හැකි වරණීය කොටස්		400,000	
		1,150,000	
සංචිත			
පොදු සංචිතය			112,000
ලාභ ලාභ ගිණුම	95,000		
207,000			
බැංකු ශේෂය			180,000
ආයෝජන			200,000

අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත නිදහස් කළ හැකි වරණීය කොටස් 3/4 ක් එකක් රු: 22.50 බැගින් ගෙවමින් නිදහස් කරන ලදී. මෙම කාර්යයේදී අවශ්‍ය මුදල් රැස්කර ගැනීම සඳහා පිරිවැය රු: 75,000 ක් වු ආයෝජනය රු: 160,000 ට විකුණන ලදී. නිකුත් කර ඇති වරණීය කොටස් ගණන 20,000 කි.

ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් සහ ගිණුම් පෙන්වන්න.

ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම(Issue of Debentures & Redemption of Debentures)

මුලින්ම ණයකරයක් යනු කුමක්ද යන්න හඳුනා ගනිමු. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ණයකරයක් යනු ''සමාගම ණයක් ලබාගත් බවටත් එම ණය අනාගත නිශ්චිත දිනයකදී අදාළ නියමයන්ට යටත්ව ආපසු ගෙවා නිදහස් කරන බවත් දක්වමින් සමාගමේ නිළ මුද්‍රාව සහිතව මහජනතාව වෙත නිකුත් කරන ලියවිල්ලකි.''

සමාගම ණයකර නිකුත් කිරීමෙන් සමාගමට අවශ්‍ය වන්නා වු මූල්‍ය රැස්කර ගැනීමට බලාපොරොත්තු වන බව මෙම පැහැදිලි කිරීමෙන් පෙනී යයි. එලෙසම එය ණයක් ලෙස සලකන බවද ඒ තුළින්ම පැහැදිලි කර තිබේ. ණයකර නිකුත් කිරීමෙන් සමාගම ණය ලබාගැනීමක් සිදුකරයි නම්, එම ණය අනාගත නිශ්චිත දිනයක දී නැවත ගෙවා නිදහස් කළ යුතු අතර නිදහස් කරන තුරු ඒ සඳහා නිශ්චිත පොලියක්ද ගෙවිය යුතුවේ. එනිසා ණයකර නිකුත් කරන අවස්ථාවේදීම ඒවා නැවත නිදහස් කරන දිනයත් ඒ වෙනුවෙන් ගෙවන පොළියත් නිදහස් කිරීමට අදාළ අනෙකුත් විධිවිධානත් ප්‍රකාශයට පත්කරනු ලබයි.

මෙලෙස සමාගමක් නිකුත් කරන ණයකර ප්‍රධාන වශයෙන් දෙවර්ගයකි.

1. උකස් ණයකර

   එනම් ණයකර නිකුත් කරන අවස්ථාවේදී එම ණයකර වෙනුවෙන් සමාගම සතු වත්කම් ඇපයට තැබීමයි. උදාහරණ ලෙස සමාගමෙහි ඉඩම් හා ගොඩනැගිලි ඇප ලෙස තබා ණයකර නිකුත් කිරීමයි. මෙවැනි උකස් ණයකර නිකුත් කර ඇති විටෙකදී ඒවා නියමිත දිනට නිසි පරිදි නැවත ගෙවා නිදහස් කිරීමට අපොහොසත් වුවහොත් ඒ වෙනුවෙන් ඇපයට තබා ඇති වත්කම් උපලබ්ධි කොට ණයකර වලට අදාළ මුදල් ගෙවීමට බැඳේ.

2. විවෘත ණයකර

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

එනම් සමාගම සතු කිසිඳු වත්කමක් ඇපයට නොතබා නිකුත් කරන ණයකරයි. මේ නිසා මෙවැනි ණයකරවලට කිසිඳු ආරක්ෂාවක් නිකුත් කරන අවස්ථාවේදී ලබානොදේ.

ණයකර නිකුත් කිරීම

ණයකර නිකුත් කිරීම කොටස් නිකුත් කළ අයුරින්ම සංස්ථා ප්‍රකාශයක් ප්‍රකාශයට පත්කොට සිදු කරනු ලබයි. මෙහිදී දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වන්නේ ණයකරයක වෙළඳ මිල එකවර අය කිරීමයි. නමුත් කොටස් නිකුත් කිරීමේදී කොටසක නිකුතු මිල අයකිරීම එකවර සිදු කරන අවස්ථා මෙන්ම අවස්ථා කිහිපයකදී (අයදුම හා ඇරයුම ලෙස) ලබා ගැනීම ද දැකිය හැකි විය.

ණයකරයක නාමික මිලත් එය මහජනතාව වෙත නිකුත් කරන මිලත් (වෙළඳ මිල) සැලකීමේ දී ණයකර නිකුත් කිරීම පහත අවස්ථා යටතේ හඳුනාගත හැක.

1. සම මිලට නිකුත් කිරීම.

   එනම් ණයකරයක නාමික මිලට සමාන මිලකට ණයකර මහජනතාව වෙත නිකුත් කිරීමයි.

   නාමික මිල = වෙළඳ මිල

   මෙහිදී සමාගම් ණයකර නිකුත් කිරීමෙන් ලාභ හෝ පාඩු ඇති නොවන අතර පහත ලෙස ගිණුම් තැබීම සිදු කරයි.

   i. නිකුත් කරන ණයකරවල නාමික මිල

ණයකර නිකුත් කිරීමේ ගිණුම	-	හර
ණයකර ගිණුම	-	බැර

ණයකර වලට මුදල් ලැබීම (වෙළඳ මිල)

මුදල් පොත	-	හර
ණයකර නිකුත් කිරීමේ ගිණුම	-	බැර

උදාහරණ - 35

සීමිත හෙක්ටර් සහ සමාගම එකක් රු 100/- ක් වූ 18% ණයකර 10,000 ක් නිකුත් කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කරන ලදී. ණයකර 12,000 ක් සඳහා අයදුම්පත් ලද අතර වැඩිපුර ලද අයදුම්පත් 2,000 මුදල් ද සමඟ ප්‍රතික්ෂේප කරන ලදී.

ණයකරයක් මහජනතාව වෙත නිකුත්කරන මිල රු 100 කි.

අවශ්‍ය ගිණුම් සටහන් පෙන්වන්න.

ණයකර නිදහස් කිරීම

ණයකර මහජනතාව වෙත නිකුත් කරන දිනයේදීම ඒවා නැවත නිදහස් කරන දිනයන් හා ඊට අදාළ කොන්දේසි ප්‍රකාශයට පත්කරනු ලබයි. මේ නිසා එහි සඳහන් නිශ්චිත දිනට හෝ ඊට පෙර දිනයක දී ණයකරහිමියන්ට මුදල් ගෙවා නිදහස් කළ යුතු වේ.

ණයකර නිදහස් කිරීමේදී අදාළ වන ද්විත්ව සටහන්,

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

I. නිදහස් කරන ණයකරවල නාමික මිල

ණයකර ගිණුම	-	හර
ණයකර නිදහස් කිරීමේ ගිණුම	-	බැර

II. නිදහස් කිරීමේදී අධිමිලක් පවතී නම්,

ණයකර නිදහස් කිරීමේ අධිමිල ගිණුම	-	හර
ණයකර නිදහස් කිරීමේ ගිණුම	-	බැර

III. ණයකරහිමියන්ට මුදල් ගෙවීම

ණයකර නිදහස් කිරීමේ ගිණුම	-	හර
මුදල් පොත	-	බැර

මෙහිදී ඔබට පැහැදිලි වන කරුණක් වන්නේ වරණීය කොටස් නිදහස් කිරීමේදී මෙන්ම ණයකර නිදහස් කිරීමේදී ඒ සඳහා සමාගම සතුව මූල්‍ය හැකියාවක් පැවතිය යුතු බවයි. එනම් ණයකරහිමියන්ට ගෙවීමට මුදල් සමාගම සතුව ණයකර නිදහස් කරන අවස්ථාවේදී පැවතිය යුතු බවයි. මේනිසා ණයකර නිදහස් කිරීමට අවශ්‍ය වන්නා වූ මූල්‍ය සමාගම විසින් සපයා ගන්නා ආකාරය සැළකිල්ලට ගතහොත් එය සිදුකළ හැකි ප්‍රධාන ක්‍රම පහත පරිදි වේ.

1. නව කොටස් හෝ ණයකර නිකුත් කිරීම.
2. බැංකු ණයක් ලබාගැනීම.
3. වත්කම් අලෙවිය - මෙහෙයුමට බලපෑමක් නොමැති ආයෝජන වැනි.
4. වත්කම් අලෙවිය හා නැවත කල්බදු ගැනීම.
5. ණයකර නිකුත් කළ අවස්ථාවේ සිට ක්‍රමාණුකූලව අරමුදලක් ගොඩනැගීම
   (නිදන් අරමුදල් ක්‍රමය)

<u>**සමාගම සතුව අවශ්‍ය මූල්‍ය ශක්තියක් පවතී නම්**</u>

උදාහරණ - 36

සීමිත දේවා සමාගමේ 2016.03.31 දිනට සැකසූ ශේෂ පත්‍රයෙන් උපුටාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

18% ණයකර	- 750,000	
සංචිත		
පොදු සංචිතය	- 45,000	
ලාභාලාභ ගිණුම		- 280,000
මුදල්	- 390,000	

මෙම සමාගම 2016.03.31 දිනට පැවති ණයකර වලින් රු. 100,000 නාමික මිලක් ඇති ණයකර 12% අධිමිලක් ද සහිතව නිදහස් කිරීමට තීරණය කරන ලදී.

ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ගිණුම් පෙන්වන්න.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

නව කොටස් හෝ ණයකර නිකුත් කිරමින් මූල්‍ය රැස් කරයි නම්

උදාහරණ - 37

සීමිත රංග සමාගමේ 2016.03.31 දිනට සැකසූ ශේෂ පත්‍රයෙන් උපුටාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය	-	650,000
15% ණයකර	-	300,000
සංචිත		
පොදු සංචිතය	-	85,000
ලාභාලාභ ගිණුම	-	80,000
මුදල්	-	105,000

මෙම සමාගම 2016.03.31 දිනට පැවති ණයකරවලින් රු. 150,000 නාමික මිලක් ඇති ණයකර 10% අධිමිලක් ද සහිතව නිදහස් කිරීමට තීරණය කරන ලදී. අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා සාමාන්‍ය කොටස් 2,000 ක් කොටසක් රු. 35/- බැගින් මහජනතාවට නිකුත් කරන ලදී.

ඔබ විසින්,

ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ගිණුම් පෙන්වන්න.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

<u>වත්කම් අලෙවිය - මෙහෙයුමට බලපෑමක් නොමැති - ආයෝජන වැනි</u>

උදාහරණ - 38

සීමිත කසුන් සමාගමේ 2016.03.31 දිනට සැකසූ ශේෂ පත්‍රයෙන් උපුටාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	-	400,000
12% ණයකර	-	250,000
සංචිත		
පොදු සංචිතය	-	100,000
ලාභාලාභ ගිණුම	-	125,000
මුදල්	-	95,000
ආයෝජනය	-	150,000

මෙම සමාගම 2016.03.31 දිනට පැවති ණයකර වලින් රු. 200,000 නාමික මිලක් ඇති ණයකර 10% අධිමිලක් ද සහිතව නිදහස් කිරීමට තීරණය කරන ලදී. අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා සාමාන්‍ය කොටස් 1000 ක් කොටසක් රු. 15/- බැගින් මහජනතාවට නිකුත් කරන ලදී. ඊට අමතරව අවශ්‍ය මුදල් රැස්කර ගැනීම සඳහා පිරිවැය රු. 95,000 ක් වූ ආයෝජනය රු. 125,000 විකුණන ලදී.

ඔබ විසින්, ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ගිණුම් පෙන්වන්න.

සීමිත සමාගම් අවසන් ගිණුම්

සීමිත සමාගම් සඳහා අවසන් ගිණුම් සැකසීමේදී සමාගමකට ආවේණික වූ පහත ලක්ෂණය මුලින්ම හඳුනාගත යුතුය. එයනම් සමාගමක පාලනය හා එහි හිමිකාරත්වය පැහැදිලි වශයෙන් වෙන් වූ ඒකක දෙකක් වන බව. එනම් සමාගමක පාලනය වාර්ෂිකව පත්කරගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සිදු කරන අතර සමාගමෙහි හිමිකාරිත්වය කොටස්කරුවන් සතුවීමයි. මෙලෙස සමාගමක පාලනය හා හිමිකාරිත්වය වෙන් වූ ඒකක 2 ක් ලෙස හඳුනාගත හැකි නිසා අවසන් ගිණුම් සැකසීමේදී ද මෙම ඒකක 2 ක සඳහා වෙන් වූ මූල්‍ය ප්‍රකාශන කට්ටල 2 ක් සැකසිය හැකි වේ. එනම්,

1. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසන් ගිණුම් සැකසීම
2. කොටස්කරුවන් සඳහා අවසන් ගිණුම් සැකසීම

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසන් ගිණුම්

(අභ්‍යන්තතර ප්‍රයෝජන සඳහා/ අභ්‍යන්තර භාවිතය සඳහා/ කළමනාකරන අවශ්‍යතා සඳහා පිළියෙල කරන ගිණුම් සවිස්තරාත්මක අවසන් ගිණුම් ලෙසද හඳුන්වනු ලබයි.)

මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සැකසීමේදී එයට ප්‍රධාන වශයෙන් ප්‍රකාශන 5 ක් ඇතුළත් විය යුතු බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 01 න් (LKAS - 01) නිර්දේශ කර තිබේ.

සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක පහත දෑ තිබිය යුතුය.

a. **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** - Statement of Financial Position

b. **විස්තීරණ ආදායම් ප්‍රකාශය** - Descriptive Income Statement;

c. **හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය** - A Statement of Changes In Equity

d. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** - A Cash Flow Statement

e. **සටහන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් විස්තරාත්මක සටහන්** - Notes, comprising a summary of Significant Accounting Policies and other Explanatory Notes

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසන් ගිණුම් සැකසීමේදී ඉහත සඳහන් ප්‍රකාශන 5 අතුරින් ප්‍රකාශන 2 ක් පමණක් සකසන අයුරු අන්තර්මධ්‍ය මට්ටමේ දී සලකා බලන ලදී. ඒවානම්,

❖ ආදායම් ප්‍රකාශය

(වෙළඳ ක්‍රියාකාරීත්වයක නියැලෙන ව්‍යාපාරය නම් මෙය ''වෙළඳ හා ලාභාලාභ ගිණුම'' ලෙස නම් කරයි. එහිදී ව්‍යාපාරය විසින්ම අදාළ භාණ්ඩය නිෂ්පාදනය කර විකිණීමේ නියැලේ නම් නිෂ්පාදන ගිණුම ද එක්කළ යුතු අතර එවිට ''නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම'' ලෙස නම් කරයි.)

❖ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තනි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක දී සකසන අකාරය ඔබ මේ වනවිටත් හදාරා ඇත. සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසන් ගිණුම් සැකසීම හා ඉදිරිපත් කිරීමේ දී ද තනි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක අවසන් ගිණුම් සැකසීමේ දී අනුගමනය කළ ගිණුම්කරන ක්‍රියාපිළිවෙත් එලෙසම යොදා ගන්නා අතර පහත විශේෂිත ගිණුම්කරණ ගැලපීම් පමණක් මෙහිදී අමතරව හඳුනා ගැනීමට සිදු වේ. ඒවානම්,

- බදු ගැලපීම හා
- බදු පසු ලාභය විසර්ජනය කිරීමයි.

මේවා එකිනෙක වෙන වෙනම ගෙන සාකච්ඡා කරමු.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- **බදු (Company Tax)**

ආදායම් බදු පනතට අනුව නෛතික පුද්ගලභාවයක් හිමි ඕනෑම තැනැත්තෙක් තමා උපයන ආදායම මත බදු ගෙවීමට යටත් වේ. මේ අනුව සමාගමකට ද නෛතික පුද්ගලභාවයක් පවතින නිසා බදු පනතේ නීතිරීති වලට යටත්ව උපයන ආදායම මත බදු ගෙවීමට සිදු වේ. මෙලෙස උපයන ආදායම මත සමාගමකට ගෙවීමට සිදුවන බද්ද සමාගමකට වියදමක් වනු ලැබේ. නමුත් සමාගමේ අනෙකුත් වියදම් හා සැසඳීමේ දී මෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ ගිණුම් වර්ෂය අවසාන වී මූල්‍ය ප්‍රකාශය සකසන විට එම සත්‍ය බදු වියදම හඳුනාගත නොහැකි වීමයි. මේනිසා ගණකාධිකාරීවරුන් විසින් පහත ක්‍රමයක් යොදා ගනිමින් වාර්ෂික බදු වටිනාකම ගණනය කරයි.

- වාර්ෂික පදනම
- ස්වතක්සේරු පදනම

මෙහි වාර්ෂික පදනමේදී සිදුවන්නේ මුළු වර්ෂය සඳහාම බදු වටිනාකමක් එකවර තීරණය කිරීමයි. මුළු වර්ෂයටම එකවර බදු වටිනාකම තීරණය කිරීමේදී ඒ සඳහා සත්‍ය බදු වියදම හඳුනාගත නොහැකි නිසා ඇස්තමේන්තුගත අගයක් ගණකාධිකාරීවරුන් විසින් ගණනය කොට ඒ සඳහා ලාභයෙන් වෙන්කිරීමක් කරනු ලබයි.

අදාළ ද්විත්ව සටහන,

බදු ගිණුම	-	හර
බදු වෙන්කිරීමේ ගිණුම	-	බැර

මෙම බදු ගිණුම වියදම් ගිණුමක් වන අතර එය ලාභයට එරෙහිව කපාහරිනු ලබයි. එලෙසම මෙම බදු වියදම් ඉතා වැදගත් හා ප්‍රමාණාත්මක අගයක් ගනු ලබන නිසා ලාභයෙන් වෙනම අඩුකොට නිරූපනය කළ යුතුය. බදු වෙන්කිරීමේ ගිණුම පසු වර්ෂයේ දී සත්‍ය බදු වටිනාකම හඳුනාගෙන මුදලින් ගෙවන තෙක් වගකීමක් ලෙස හඳුනාගත යුතුය.

උදාහරණ - 39

සීමිත ග්‍රහලෝක සහ සමාගම 2014.04.01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද අතර 2015.03.31 න් අවසන් වර්ෂයෙහි පොත්වලින් උපුටාගත් දත්ත කිහිපයක් පහත වේ.

බදු පෙර ශුද්ධ ලාභය - 500,000

අතිරේක තොරතුරු:

මෙම සමාගම් 2014/2015 වර්ෂය සඳහා බදු වගකීම රු. 110,000 ලෙස ඇස්තමේන්තුගත කරයි.

ඔබ විසින්,

බදු සඳහා ගිණුම් තබන අයුරු සහ අවසන් ගිණුම්වල සටහන් පෙන්වන්න.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

මෙලෙස සමාගමක් බදු වියදම ලෙස ඇස්තමේන්තුගත අගයක් වෙන්කොට අවසන් ගිණුම් සැකසීමෙන් පසු ඒවා විගණනයට ලක් කරනු ලබයි. සමාගමක මූල්‍ය ප්‍රකාශන විගණනයට ලක්වීමෙන් පසු අදාළ වර්ෂය සඳහා ගෙවිය යුතු සත්‍ය බදු වටිනාකම හඳුනාගත හැකිවනු ලැබේ. ඒ අනුව විගණනයට පසු හඳුනාගන්නා සත්‍ය බදු වටිනාකමත් ඒ වෙනුවෙන් වෙන් කළ ඇස්තමේන්තුගත බදු වටිනාකමත් අතර වෙනසක් ද පැවතිය හැක. එලෙස සත්‍ය බදු වටිනාකමත් ඇස්තමේන්තුගත බදු වටිනාකමත් අතර වෙනසක් පවතින විටක පහත අවස්ථා හඳුනාගත හැකිවනු ලැබේ.

i. ඌණ බදු වෙන්කිරීම

ii. අධි බදු වෙන්කිරීම

i. ඌණ බදු වෙන්කිරීම

එනම් අදාළ වර්ෂයේ ඇස්තමේන්තුගත බදු වෙන්කිරීමට වඩා සත්‍ය වශයෙන් ගෙවිය යුතු බදු වටිනාකම වැඩිවීමයි. මෙම ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි සත්‍ය බදු වටිනාකමේ අගය ඌණ බද්ද ලෙස හඳුනාගෙන එය ද ලාභයට එරෙහිව කපාහැරිය යුතු අතර එම ප්‍රමාණය ඌණ බදු වටිනාකම හඳුනාගත් වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැරීම කළ යුතු බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 08 :ඛණී - 08* සඳහන්ව පවතී.

(එනම් ඇස්තමේන්තුවක සිදුවන වෙනස්වීම් එය හඳුනාගත් වර්ෂයේ ලාභයට එරෙහිව කපාහළ යුතු බවයි.)

උදාහරණ - 40

ඉහත සීමිත ග්‍රහලෝක සහ සමාගමේ 2016.03.31 අවසන් වර්ෂයේ දී උපුටාගත් දත්ත කිහිපයක් පහත වේ.

	හර	බැර
බදු පෙර ශුද්ධ ලාභය		675,000
බදු වෙන්කිරීම 2015.04.01		110,000
ගෙවූ බදු	125,000	

අතිරේක තොරතුරුඃ

2014/2015 වර්ෂය සඳහා සත්‍ය බදු වගකීම රු. 125,000 ට එකඟ වී ඇති අතර එය ප්‍රවර්තන වර්ෂයේදී සම්පූර්ණයෙන්ම මුදලින් ගෙවන ලදී. 2015/2016 වර්ෂය සඳහා බදු වෙන්කිරීම රු. 160,000 ලෙස ඇස්තමේන්තුගත කරයි.

ඔබ විසින්, බදු සඳහා ගිණුම් තබන අයුරු සහ අවසන් ගිණුම්හි නිරූපණයන් පෙන්වන්න.

ii. අධිබදු වෙන්කිරීම

එනම් ඇස්තමේන්තුගත බදු වෙන්කිරීමට වඩා සත්‍ය බදු බැඳියාව අඩු අගයක් ගැනීමයි. ඒ අනුව ලාභයෙන් වෙන්කළ ප්‍රමාණයට වඩා බදු දෙපාර්තමේන්තුවෙන් ගෙවීමට නියම කරන ප්‍රමාණය අඩු අගයක් ගනී. මෙහිදී මෙම වැඩියෙන් ලාභයෙන් සිදු කළ වෙන්කිරීම්

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

වටිනාකම අධි බදු වෙන්කිරීම ලෙස හඳුන්වන අතර එය අදාළ වර්ෂයේ ලාභයට නැවත එකතු කළ යුතුය.

උදාහරණ - 41

ඉහත සීමිත ග්‍රහලෝක සමාගමේ 2017.03.31 න් අවසන් වර්ෂයේ දත්ත කිහිපයක් පහත වේ.

බදු පෙර ශුද්ධ ලාභය	600,000
බදු සඳහා වෙන්කිරීම 2016.04.01	160,000
ගෙවූ බදු	140,000

අතිරේක තොරතුරු:

2015/2016 වර්ෂය සඳහා සත්‍ය බදු බැඳියාව රු. 140,000 එකඟ වූ අතර එය 2016/2017 වර්ෂයේ දී සම්පූර්ණයෙන්ම ගෙවන ලදී. 2016/2017 වර්ෂය සඳහා බදු සඳහා වෙන්කිරීම රු. 150,000 ට ඇස්තමේන්තුගත කර තිබේ.

ඔබ විසින්,

බදු සඳහා ගිණුම් තබන අයුරු සහ අවසන් ගිණුම්වල සටහන් පෙන්වන්න.

උදාහරණ - 42

සීමිත අයිඩැක් සමාගමේ 2016.03.31 අවසන් වසරේ පහත දත්ත පැවතුණි.

විකුණුම්				1,520,000
පරිපාලන වියදම්		120,000		
බෙදාහැරීම් වියදම්	80,000			
මූල්‍ය වියදම්	20,000			
බදු සඳහා වෙන්කිරීම 2015.04.01			150,000	
ගෙවූ බදු	235,000			
විකුණු බඩුවල පිරිවැය		800,000		

අතිරේක තොරතුරු:

2014/2015 වර්ෂය සඳහා සත්‍ය බදු වගකීම රු. 160,000 වූ අතර එය 2015/2016 වර්ෂයේ දී ගෙවන ලදී. 2015/2016 වර්ෂය සඳහා බදු වෙන්කිරීම රු. 175,000 ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

ඔබ විසින්,

ආදායම් ප්‍රකාශය සකස් කොට බදු පසු ලාභය ගණනය කරන්න.

JMC vLearning "your virtual learning partner"

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

උදාහරණ - 43

JMC සමාගමේ 2016 දී ඉදිරියට ගෙන ආ 2015 වසරට සම්බන්ධිත බදු වගකීම රු. 112,000 කි. මෙම වගකීම අවසාන වශයෙන් රු. 129,500 කට එකඟ වී 2016 දී ගෙවා ඇත. JMC සමාගම 2016 වසරේ උපයන ලාභ වලින් වන බදු වගකීම රු. 140,000 ක් වනු ඇතැයි එහි ගණකාධිකාරී ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2016.03.31 න් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ ගිණුමේ බදු වියදම වශයෙන් අය කළ යුතු වටිනාකම ගණනය කරන්න.

- **බදු පසු ලාභය විසර්ජනය කිරීම**

සමාගමකට අදාළ බදු වියදම ගැලපීමෙන් පසු ඉතිරි වන ලාභය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය තීරණය කිරීමේ බලතල අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුවනු ලැබේ. ඒ අනුව එම බදු පසු ලාභය බෙදා හැරීම (විසර්ජනය කිරීම) කෙසේ සිදුකරන්නේද, යන්න අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය කරනු ලබයි. එම බදු පසු ලාභය පහත ප්‍රමුඛත්වයන් යටතේ බෙදා හැරීම සිදු කරන අතර එය ''විසර්ජන ගිණුමක්'' උපයෝගි කොටගෙන ගිණුම්ගත කරයි.

1. සංචිත සඳහා වෙන්කිරීම

මෙහි ''සංචිත'' යන්නෙහි අර්ථය වන්නේ සමාගම උපයා ඇති ලාභ වලින් එහි හිමිකරුවන් අතර බෙදා නොහැර ව්‍යාපාරය තුළ රඳවා ගන්නා ලාභයයි. එනම් හිමිකරුවන් අතර නොබෙදු රඳවාගත් ලාභයන්ය. මෙලෙස ව්‍යාපාරය තුළ රඳවාගනු ලබන නොබෙදු ලාභ (සංචිත) ප්‍රධාන වශයෙන් කොටස් 2 ට බෙදිය හැකි අතර එම වර්ගීකරණයේ දී යොදාගනු ලබන පදනම වන්නේ එම රඳවාගත් ලාභ අනාගතයේ දී හිමිකරුවන් අතර (කොටස්කරුවන්) ලාභාංශ ලෙස (ලාභය ලෙසට) නැවත බෙදාහැරිය හැකි ද නැද්ද යන්නයි. ඒ අනුව,

i. ප්‍රාග්ධන සංචිත :ක්වසඑ්ක සෑැරඩැ*

නොබෙදු ලාභ අතුරින් අනාගතයේ දී කොටස්කරුවන් අතර ලාභාංශ ලෙස බෙදාහැරිය නොහැකි ලාභ ප්‍රාග්ධන සංචිත ලෙස හඳුන්වනු ලබයි. එනම් එවැනි සංචිත නැවත ලාභාංශ ලෙස කොටස්කරුවන් අතර බෙදාහැරිය නොහැකි බවයි.

ii. අයභාර සංචිත :සෑඩැබමැ සෑැරඩැ*

නොබෙදු ලාභ අතුරින් අනාගතයේ දී හිමිකරුවන් අතර ලාභාංශ ලෙස නැවත බෙදාහැරිය හැකි ලාභ අයභාර සංචිත ලෙස හඳුන්වයි. එනම් රඳවාගත් ලාභ නැවත ලාභාංශ ලෙස කොටස්කරුවන්ට බෙදාහැරිය හැකි බවයි.

උදා : පොදු සංචිතය

ලාභාලාභ ගිණුම දැක්විය හැක

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

සංචිත සඳහා වෙන්කිරීම් කරන විට, (ගලපන සිදුවීම්)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 10 (LKAS – 10)

ලාභාලාභ විසර්ජන ගිණුම	-	හර
සංචිත ගිණුම	-	බැර කළ යුතුය

මෙය සංචිත හිමිකමේ කොටසක් වන නිසා ශේෂ පත්‍රයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනයට එකතු කොට නිරූපනය කළ යුතුය.

2. ලාභාංශ බෙදා හැරීම

ලාභාංශ ලෙස මෙහිදී අදහස් කරනු ලබන්නේ ඉපයූ ලාභයෙන් කොටස්කරුවන් අතර බෙදාහරින ප්‍රමාණයයි. මෙලෙස කොටස්කරුවන් අතර බෙදාහරින ලාභාංශ ප්‍රධාන වශයෙන් පහත ලෙස වර්ග කළ හැක.

i. අතුරු ලාභාංශ (Interim Dividend)

ii. යෝජිත ලාභාංශ (Proposed Dividend)

i. අතුරු ලාභාංශ

ගිණුම් කාලච්ඡේදය තුළදී ප්‍රකාශයට පත්කොට ගිණුම් කාලය අවසාන වන විට මුදලින් ගෙවා අවසාන වී ඇති ලාභාංශ අතුරු ලාභාංශ වේ.

අදාළ ද්විත්ව සටහන

අතුරු ලාභාංශ ගිණුම	-	හර
මුදල් පොත	-	හැර

මෙය මුදලින් ගෙවා අවසාන වී ඇති හෙයින් සමාගම සතුව වගකීමක් නොපවතින අතර කළ යුතු එකම කාර්ය වන්නේ එම අතුරු ලාභාංශ ප්‍රමාණය ලාභයට එරෙහිව කපාහැරීම පමණි.

සමාගමක් විසින් ප්‍රකාශයට පත්කරන අතුරු ලාභාංශ සමාගම විසින් නිකුත් කර ඇති කොටස් දෙවර්ගය සඳහාම ප්‍රකාශ කළ හැක. එනම් සාමාන්‍ය කොටස් සඳහා සහ වරණීය කොටස් සඳහාය. මෙහි සාමාන්‍ය කොටස් සඳහා නිශ්චිත ලාභාංශයක් හිමිනොවන නිසා අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය ප්‍රමාණයක් ලාභාංශ ලෙස තීරණය කළ හැකි අතර වරණීය කොටස් සඳහා නිශ්චිත ලාභාංශයක් තීරණය කර ඇති හෙයින් එම නිශ්චිත ප්‍රමාණයට වඩා වැඩි වටිනාකමක් අතුරු ලාභාංශ ලෙස ප්‍රකාශ කළ නොහැක.

ii. යෝජිත ලාභාංශ

ගිණුම් කාලච්ඡේදය අවසානයේදී ප්‍රකාශයට පත්කොට මුදලින් ගෙවා නොමැති ලාභාංශ යෝජිත ලාභාංශ නම් වේ. මෙය මුදලින් ගෙවා නොමැති නිසා වර්ෂය

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

අවසාන වනවිට සමාගමට වියදම් වගකීමක් වන අතර පහත ලෙස ගිණුම් සටහන් තැබිය යුතුය.

යෝජිත ලාභාංශ ගිණුම	-	හර
ගෙවිය යුතු යෝජිත ලාභාංශ ගිණුම	-	බැර

යෝජිත ලාභාංශ ගිණුම ලාභයට එරෙහිව කපාහරින අතර ගෙවිය යුතු යෝජිත ලාභාංශ ගිණුම වගකීමක් ලෙස ශේෂ පත්‍රයෙහි නිරූපනය කළ යුතුය.

නමුත් ශ්‍රී.ල.ගි.ප්‍ර. 10 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්, අනුව සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ යෝජනා කිරීම ශේෂපත්‍ර දිනට පසු දිනක දී සිදුකර ඇත්නම්, එය නොගළපන සිදුවීමක් ලෙස හඳුනාගෙන ගිණුම් තැබිය යුතු බව දක්වා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසන් ගිණුම්

උදාහරණ - 44

සීමිත ටොප්ස්ටැට් සමාගමේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දී ඇත.

	හර (රු.000)	බැර (රු. 000)
විකුණුම්		125,550
ඉඩම් - පිරිවැයට	15,550	
ගොඩනැගිලි – පිරිවැයට	14,020	
පිරියත සහ යන්ත්‍රෝපකරණ - පිරිවැයට	45,370	
මෝටර් රථවාහන - පිරිවැයට	5,575	
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - පිරිවැයට	2,000	
ක්ෂය සඳහා ප්‍රතිපාදන		
පිරියත සහ යන්ත්‍රෝපකරණ - 2016.03.31		21,633
ගොඩනැගිලි - 2016..03.31		5,097
මෝටර් රථවාහන - 2015.03.31		2,995
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - 2015.03.31		745
ණයගැතියෝ සහ ණයහිමියෝ	31,750	11,775
2015.04.01 දිනට තොග	29,950	
ඉ/ගෙනා ලාභාලාභ ගිණුම		15,591
අධ්‍යක්ෂ ගාස්තු	1,675	
රක්ෂණ ගාස්තු	758	

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

අතෙහි සහ බැංකුවේ ඇති මුදල්	6,245	
වැටුප් හා වේතන	15,775	
කීර්තිනාමය	6,750	
ආයෝජන (ජංගම)	8,250	
12% ණයකර		15,000
පොදු සංචිත		12,682
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		36,000
නිදහස් කළ හැකි වරණීය කොටස්		20,000
ගෙවූ බදු - 2015/2016	2,500	
අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය		1,000
ගැණුම්	61,925	
විගණන ගාස්තු	300	
වෙනත් පරිපාලන වියදම්	3,875	
වෙනත් බෙදාහැරීමේ වියදම්	2,750	
කළමනාකාර අධ්‍යක්ෂට ගෙවූ වැටුප	1,800	
ණයකර පොළිය	900	
විදුලිය වියදම්	2,715	
ක්ෂය - පිරියත සහ යන්ත්‍රෝපකරණ	4,537	
- ගොඩනැගිලි	1,402	
වෙනත් මෙහෙයුම් වියදම්	1,696	
	268,068	268,068

පහත අතිරේක තොරතුරු පවතී.

1. 2016.03.31 දිනට තොගයේ පිරිවැය රු. 15,000,000/- වූ අතර එදිනට ශුද්ධ උපලබ්ධිත අගය රු. මිලියන 14හ5 ක් විය.
2. නිදහස් කළ හැකි වරණීය කොටස් වලින් කොටස් 500,000 එකක් රු. 12.50 බැගින් ගෙවමින් නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර නිදහස් කිරීමට ගෙවූ මුදල ණයගැති ගිණුමට හර කර ඇත. නිකුත් කර තිබූ වරණීය කොටස් ගණන 2,000,000
3. 2015/2016 වර්ෂය සඳහා බදු බැරකම රු. 4.,000,000 ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
4. 2016.04.20 වන දින රු. 200,000 ක ණයගැතියෙකු බොල් ණය විය. අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම තුළ සීමිත මනෝහර සමාගම වෙනුවෙන් රු. 100,000 ක නිශ්චිත ප්‍රතිපාදනයක් කර තිබූ අතර ඉතිරිය පොදු ප්‍රතිපාදනයකි. වර්ෂය තුළදී සීමිත මනෝහර සමාගම බුන්වත් වූ බවට උසාවිය තීන්දු කර ඇත. වසර අග ඉතිරි ණයගැතියන් සඳහා 5% අඩමාණ ණය වෙන් කිරීමක් කළ යුතුයි.
5. දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය අනුව පහත ප්‍රතිශතතයන්ගෙන් ක්ෂය කළ යුතුය.

    i. පිරියත හා යන්ත්‍රෝපකරණ - 10%

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ii. ගොඩනැගිලි - 10%

iii. මෝටර් රථවාහන - 20%

iv. ගෘහභාණ්ඩ හා සවිකිරීම් - 12.5%

6. 2014.10.01 දින රු. 600,000 ට මිලදීගත් ගෘහ භාණ්ඩ හා සවිකිරීම් 2015.09.30 දින රු. 425,000 විකුණන ලද අතර මේ සම්බන්ධයෙන් කර ඇති එකම සටහන වනුයේ විකිණීමෙන් ලද මුදල ගෘහ භාණ්ඩ හා සවිකිරීම් ගිණුමට බැර කිරීම පමණි.

7. පහත සඳහන් වියදම් 2016.03.31 දිනට උපචිතව පවතී.

- විගණන ගාස්තු 200,000
- විදුලිය 85,000

8. කලින් ගෙවූ රක්ෂණය රු. 58,000 කි.

9. අධ්‍යක්ෂ මණ්ඩලය පහත යෝජනා කර ඇත.

   1,500,000 පොදු සංචිතයට මාරු කිරීම.

   වරණීය කොටස් හිමියන්ගේ ලාභාංශ ගෙවීම. එක් වරණීය කොටසක් සඳහා හිමි ලාභාංශ රු. 1.75 කි. (නිදහස් කළ වරණීය කොටස්වලට ලාභාංශ හිමි නොවේ)

   සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ යෝජනා නොකරන ලදී.

ඔබ විසින්

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා 2016.03.31 න් අවසන් වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කරන්න.

උදාහරණ - 45

සීමිත සමනල ට්‍රේඩින් සමාගමේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දී ඇත.

	හර (රු.000)	බැර (රු.000)
වර්ෂය සඳහා විකුණුම්		125,550
ඉඩම් - පිරිවැයට	15,550	
ගොඩනැගිලි - පිරිවැයට	14,020	
පිරියත සහ යන්ත්‍රෝපකරණ - පිරිවැයට	45,370	
මෝටර් රථවාහන - පිරිවැයට	5,575	
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - පිරිවැයට	2,000	
ක්ෂය සඳහා ප්‍රතිපාදන		
- පිරියත හා යන්ත්‍රෝපකරණ - 2017.03.31		21,633
- ගොඩනැගිලි - 2017.03.31		5,097
- මෝටර් රථවාහන - 2016.04.01		2,995

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- ගෘහ භාණ්ඩ සහ සවිකිරීම - 2016.04.01		745
ණයගැතියෝ සහ ණයහිමියෝ	31,750	11,775
2016.04.01 දිනට තොග	29,950	
ඉ/ගෙනා ලාභාලාභ ගිණුම		15,591
අධ්‍යක්ෂ ගාස්තු	1,675	
රක්ෂණ ගාස්තු	758	
අතෙහි මුදල්	345	
බැංකු මුදල්	5,900	
වැටුප් හා වේතන	15,775	
කීර්තිනාමය	6,750	
ආයෝජන	8,250	
12% ණයකර		15,000
පොදු සංචිත		12,682
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		36,000
නිදහස් කළ හැකි වරණීය කොටස්		20,000
ගෙවූ බදු - 2016/2017	2,500	
අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය		1,000
ගැණුම්	61,925	
විගණන ගාස්තු	300	
වෙනත් පරිපාලන වියදම්	3,875	
වෙනත් බෙදාහැරීමේ වියදම්	2,750	
කළමනාකාර අධ්‍යක්ෂට ගෙවූ වැටුප	1,800	
ණයකර පොළිය	900	
විදුලිය වියදම්	2,715	
ක්ෂය - පිරියත සහ යන්ත්‍රෝපකරණ	4,537	
- ගොඩනැගිලි	1,402	
වෙනත් මෙහෙයුම් වියදම්	1,696	
	268,068	268,068

පහත අතිරේක තොරතුරු පවතී.

1. 2017.03.31 දිනට තොගයේ පිරිවැය රු. 25,000,000 ක් වූ අතර, ශුද්ධ උපලබ්ධිත අගය රු. මිලියන 24ශ5 ක් විය.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

2. නිදහස් කළ හැකි වරණීය කොටස්වලින් කොටස් 500,000 එකක් රු. 14.00 බැලින් ගෙවමින් නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර, නිදහස් කිරීමට ගෙවූ මුදල ණයගැති ගිණුමට හර කර ඇත. නිකුත් කර තිබූ වරණීය කොටස් ගණන 2 000,000.

3. 2016/2017 වර්ෂය සඳහා බදු බැරකම රු. 4,000,000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

4. රු. 200,000 බොල් ණය ලෙස කපාහැරිය යුතු අතර ඉතිරි ණයගැතියන් සඳහා 10% අඩමාණ ණය වෙන් කිරීමක් කළ යුතුයි.

5. දේපළ, පිරියත හා උපකරණ භාවිතයට ගැනීමට පවතින අවස්ථාවේ සිට සරල මාර්ග ක්‍රමයට අනුව පහත ප්‍රතිශතයන්ගෙන් ක්ෂය කළ යුතුය.

- පිරියත හා යන්ත්‍රෝපකරණ - 10%
- ගොඩනැගිලි - 10%
- මෝටර් රථවාහන - 20%
- ගෘහ භාණ්ඩ හා සවිකිරීම් - 12.5%

6. 2014.10.01 දින රු. 500,000 ට මිලදීගත් ගෘහ භාණ්ඩ හා සවිකිරීම් 2016.09.30 දින රු. 400,000 විකුණන ලද අතර මේ සම්බන්ධයෙන් කර ඇති එකම සටහන වනුයේ විකිණීමෙන් ලද මුදල ගෘහ භාණ්ඩ හා සවිකිරීම් ගිණුමට බැර කිරීම පමණි

7. පහත සඳහන් වියදම් 2017.03.31 දිනට උපචිතව පවතී.

- විගණන ගාස්තු - 200,000
- විදුලිය - 85,000

8. 2017.03.31 දිනට කලින් ගෙවූ රක්ෂණය රු. 58,000 කි.

9. 2017.03.31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය මුදල් පොතේ බැංකු ශේෂය සමග අසමානව පැවැති අතර එම වෙනස්වීමට හේතු සොයා බැලීමේදී පහත කරුණු අනාවරණය විය.

රු. '000

a. පහත දෑ බැංකු ප්‍රකාශයේ පමණක් සටහන්ව පැවතුණි

-	හර බද්ද	28
-	බැංකු ගාස්තු	36

b. රු. 588,000 ක චෙක්පතක් නිකුත් කර තිබුණ ද 2017.03.31 දින වන විටත් ඒවා බැංකුවට ඉදිරිපත්ව නොතිබුණි

10. 2017.04.20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය පහත යෝජනා කර ඇත.

- 1,500,000 පොදු සංචිතයට මාරු කිරීම.
- වරණීය කොටස්හිමියන්ගේ ලාභාංශ ගෙවීම. එක් වරණීය කොටසක් සඳහා හිමි ලාභාංශ රු. 1.75 කි.(නිදහස් කළ වරණීය කොටස්වලට ලාභාංශ හිමි නොවේ)
- සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ යෝජනා නොකරන ලදී.

11. මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට බලය පවරන ලද්දේ 2017.06.20 දිනදීය.

ඔබ විසින්,

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා 2017.03.31 න් අවසන් වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස්කරන්න.

උදාහරණ - 46

පහත සඳහන් ශේෂ පිරික්සුම සීමිත සැනසුම සමාගමෙන් 2017 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදී.

	හර (රු. 000)	බැර (රු. 000)
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		6,195
- වරණීය කොටස්		1,500
පොදු සංචිත		630
ප්‍රත්‍යාගණන සංචිතය		225
ලාභාලාභ ගිණුම 2016.04.01		848
15% බැංකු ණය		2,100
විලම්බිත බදු		450
විකුණුම්		23,512
ආරම්භක තොගය	1,890	
ගැණුම්	13,905	
ගෙනඒමේ කුලී	705	
සින්නක්කර ඉඩම් (ප්‍රත්‍යාගණිත අගයට)	2,250	
ගොඩනැගිලි (පිරිවැයට)	3,750	
මෝටර් රථ (පිරිවැයට)	2,475	
යන්ත්‍රෝපකරණ (පිරිවැයට)	2,800	
ලී බඩු හා කාර්යාල උපකරණ (පිරිවැයට)	2,100	
සමුච්චිත ක්ෂයවීම් 2016.04.01		
ගොඩනැගිලි		937
මෝටර් රථ		570
යන්ත්‍රෝපකරණ		450
ලී බඩු හා කාර්යාල උපකරණ		173
වෙළඳ ණයගැතියෝ හා ණයහිමියෝ	2,200	675
බෙදාහැරීමේ වියදම්	953	
පරිපාලන වියදම්	2,223	
වෙනත් මෙහෙයුම් වියදම්	207	

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

පොළී ගෙවීම්	180	
බැංකු ගාස්තු	217	
බැංකු අයිරා පොලිය	83	
අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස්	300	
- වරණීය කොටස්	105	
ආදායම් බදු සඳහා වෙන්කිරීම 2016.04.01		202
ගෙවූ බදු	337	
වෙනත් මෙහෙයුම් ආදායම්		23
ආශ්‍රිතයන්හී ආයෝජනය	2,376	
ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ		48
මිල ප්‍රකාශිත ආයෝජන - පිරිවැයට	951	
අඩමාණ ණය සඳහා වෙන් කිරීම 2016.04.01		97
අතැති මුදල්	185	
බැංකු අයිරාව		657
අවිනිශ්චිත ගිණුම		900
	40,192	40,192

පහත අතිරේක තොරතුරු පවතී.

1. 2017.03.31 දිනට වෙළඳ බඩු තොගයෙහි පිරිවැය රු. 500,000 විය.
2. 2015/2016 වර්ෂය සඳහා සත්‍ය බදු බැඳියාව රු. 225,000 ට එකඟ වී ඇති අතර එය ප්‍රවර්ථන වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ගෙවා ඇත. 2016/2017 වර්ෂය සඳහා බදු සඳහා වෙන් කිරීම රු. 125,000 ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
3. ණයගැතියන්ගෙන් රු. 125,000 ක ප්‍රධාන ණයගැතියෙකු 2017.04.19 දින බුන්වත් විය. ඉතිරි ණයගැතියන් සඳහා 10% අඩමාණ ණය වෙන් කිරීමක් කළ යුතුය.
4. වර්ෂය අගදී ඉඩම් ප්‍රත්‍යාගණනය කළ අතර ප්‍රත්‍යාගණිත අගය රු. 1,950,000 විය. ඉඩම් 2014/2015 වර්ෂය තුළදී ද ප්‍රත්‍යාගණනය කළ අතර එහිදී ප්‍රත්‍යාගණන ලාභයක් බිහිව සංචිතයක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම ප්‍රත්‍යාගණිත අගය පොත්වල නිරූපණය කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා කිසිදු සටහනක් මේ වනතෙක් සිදුකර නැත.
5. 2016.07.01 රු. 1,275,000 ක මෝටර් රථ හා 2016.10.01 රු. 600,000 ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන ඇත. ඊට අමතරව රු. 300,000 වූ යන්ත්‍රෝපකරණ රු. 262,000 විකුණූ අතර එහි ධාරණ අගය රු. 225,000 ක් විය. විකිණීමෙන් ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර විකිණීමට සම්බන්ධ වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.
6. සමාගම දේපළ, පිරියත හා උපකරණ වාර්ෂික ක්ෂය වෙන් කරනුයේ පහත ප්‍රතිශතයන්ගෙනි.

ගොඩනැගිලි	- 5%
මෝටර්රථ	- 20%
යන්ත්‍රෝපකරණ	- 25%
ලී බඩු හා කාර්යාල උපකරණ	- 15%

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

7. ක්ෂය කිරීමේදී භාවිතයට ගත් කාලය පදනම් කරගනිමින් සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලැබේ.
8. 2016.11.01 දින සාමාන්‍ය කොටස් 75,000 රු. 12 කට නිකුත් කර ඇති අතර ලද මුදල් අවිනිශ්චිත ගිණුමට බැර කර ඇත.
9. ගණුදෙනුකරුවෙකු සමග ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව භාණ්ඩ සැපයීමට සමාගම අපොහොසත් වී ඇති හෙයින් ගණුදෙනුකරු විසින් සමාගමට එරෙහිව රු. 750,000 ක වන්දි ඉල්ලා නඩුවක් පවරා ඇත. 2017.03.31 වන විට සමාගමේ නීතිඥයන් පවසන්නේ මෙම නඩුවෙහි තීන්දුව පිළිබඳ නිශ්චිත අදහසක් ප්‍රකාශ කළ නොහැකි බවයි. නමුත් 2017.04.28 දින අදාළ මුදල නියත වශයෙන්ම ගෙවීමට සිදුවනු ඇති බවට නීතිඥයන් තහවුරු කරන ලදී.
10. 15% බැංකු ණය රු. 200,000 ක වාරික ලෙස අර්ධ වාර්ෂිකව ඊට අදාළ පොළියද සහිතව ගෙවනු ලබයි. මෙම වර්ෂයේ ප්‍රථම අර්ධ වර්ෂයේ වාරිකය හා පොළිය 2016.10.15 දින නිසි පරිදි ගෙවූ අතර දෙවන අර්ධ වර්ෂයේ වාරික පොළිය ද සමග 2017.04.15 දින ගෙවීමට නියමිතව පවතී.
11. සමාගම නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයන් (ඉහත ගැලපීම් අංක 7 ට පෙර)
    - සාමාන්‍ය කොටස් - 280,000
    - වරණීය කොටස - 100,000
12. අධ්‍යක්ෂවරුන් 2017.04.20 දින පැවති රැස්වීමේදී පහත යෝජනා ඉදිරිපත් කරයි.
    I. පොදු සංචිතයට රු. 80,000 ක් මාරු කිරීම.
    II. වරණීය කොටස්හිමියන්ට කොටසකට රු. 1 ක හිඟ ලාභාංශ යෝජනා කිරීම.
    III. සාමාන්‍ය කොටසක් මත රු. 1.25 ලාභාංශයක් යෝජනා කිරීම.
13. මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට බලය පවරන ලද්දේ 2017.06.20 දිනදීය.

ඔබ විසින්,

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පහත දෑ පිළියෙල කරන්න.

i. 2017.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
ii. 2017.03.31 දිනට ශේෂ පත්‍රය

උදාහරණ - 47

පහත දැක්වෙන්නේ සීමිත සල්ලි තමයි සමාගමේ 2016.03.31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුම වේ. සල්ලි තමයි සමාගම මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට බලය පවරන ලද්දේ 2016.05.30 දිනදීය.

(රු.වලිනි)

සාමාන්‍ය කොටස් එකක් රුග 25 බැගින්		600,000
ප්‍රත්‍යාගණන සංචිතය		130,000
රඳවාගත් ලාභ -2015/04/01		354,700
ආපසු එවුම් / ආපසු යැවුම්	2,750	3,800

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ගැණුම්	500,000	
වට්ටම්	6,250	4,500
ඉඩම්	1,200,000	
ගොඩනැගිලි	500,000	
මෝටර් රථ	250,000	
කාර්යාල උපකරණ	25,000	
ක්ෂය වෙන් කිරීම්		
- ගොඩනැගිලි 2015/04/01		110,000
- මෝටර් රථ 2015/04/01		109,375
- කාර්යාල උපකරණ 2015/04/01		7,500
ගෙනඒමේ කුළි	15,000	
ගෙනයාමේ කුළි	22,500	
ආරම්භක තොගය 2015/04/01	60,250	
විකුණුම්		1,200,750
ප්‍රචාරණය	18,000	
බොල් ණය	25,500	
රථවාහන වියදම්	23,000	
කුලී හා වරිපනම්	180,000	
මුදල් හා බැංකු		50,000
වැටුප් හා වේතන	200,250	
10%ණයකර 2015/04/01		300,000
අතුරු ලාභාංශ	56,000	
ණයකර පොළී	20,000	
වරණීය කොටස් – රු.12.5 බැගින් රු.0.60 ලාභාංශ		100,000
අඩමාණ ණය සඳහා වෙන්කිරීම2015/04/01		4,875
වෙළඳ ලැබිය යුතු හා ගෙවිය යුතු	98,000	81,000
පොදු සංචිත		150,000
වරණීය ලාභාංශ ගෙවීම්	4,000	
	3,206,500	3,206,500

අතිරේක තොරතුරු:

1. 2016.03.31 දිනට තොග වටිනාකම රු. 75,250 විය. එම පිරිවැය තුල පහත තොරතුරු සෙයා ගන්නා ලදී.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- පිරිවැය රු. 4,200 ක් වු තොග තුල හානි වු තොග අයිතමයක් ඇතුලත් අතර එහි විකුණුම් මිල රු. 2,000 වන තවද විකුණුම් පිරිවැයක් රු. 500 දැරිය යුතුය.
- පිරිවැය රු. 1,250 ක් වු තොග අයිතමයක් නොමිලේ නව භාණ්ඩ අලෙවියේදි ලබා දී ඇත.

2. 2016.04.10 වන දින රු. 5,500 ක ණයගැතියෙකු බොල්ණය විය. ඉතිරි ණයගැතියන් සඳහා 3% අඩමාන ණය වෙන්කිරීමක් කළ යුතුයි.
3. 2016.03.31 දිනට ඉදිරියට ගෙවු කුලි වියදම් රු. 20,000 හා වර්ෂය අගදී ගෙවිය යුතු වරිපනම් ගාස්තු රු.5,000 ක් විය.
4. සමාගමේ 2015.04.01 දිනට නිකුත් කළ කොටස් ප්‍රමාණයන් සැකසී ඇත්තේ පහත ලෙසිනි.

- සාමාන්‍ය කොටස් - 24,000
- වරණීය කොටස් නිදහස් කළ හැකි - 8,000

5. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.03.31 දින තම සමාගම සතු නිදහස් කළ හැකි වරණීය කොටස් වලින් 1/4 ක් නිදහස් කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා සාමාන්‍ය කොටස් කොටසකට රු. 25.00 බැගින් අය කරමින් නිකුත් කරන ලදී. වරණීය කොටස් සඳහා ලාභාංශ ගෙවීම සැප්තැම්බර් 30 හා මාර්තු 31 සිදු කරයි. වරණීය කොටස් නිදහස් කිරීම හා නව කොටස් නිකුතුවට අදාළ කිසිදු සටහනක් මෙතෙක් තබා නොමැත.
6. සමාගම තම වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ භාවිතා කළ කාලය මත පදනම්ව ක්ෂය කරනු ලබයි.

	එලදායි ජීවිත කාලය
- ගොඩනැගිලි	වර්ෂ 50
- මොටර් රථ	වර්ෂ 05
- කාර්යාල උපකරණ	වර්ෂ 10
- ගොඩනැගිලි	වර්ෂ 50

7. වර්ෂය තුළ 2015.10.01 දින මිලදී ගත් වත්කම් කාර්යාල උපකරණ - රු. 10,000 වේ.
8. 2012.10.01 දින රු. 500,00 ට මිලදී ගත් මෝටර් රථයක් 2015.09.30 දින රු. 350,00 ට විකුණන ලද අතර විකිණීමෙන් ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර මේ පිළිබඳ වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.
9. 2016.03.31 දිනට බැංකු ප්‍රකාශයට අනුව බැංකු ශේෂය මුදල් පොතේ බැංකු ශේෂය සමග හේතු සොයා බැලීමේදී පහත කරුණු අනාවරණය විය.

a. පහත සඳහන් ගණුදෙනු බැංකු ප්‍රකාශනයේ පමණක් සටහන් වී තිබීම.

i. බැංකු ගාස්තු රු. 65,000
ii. චෙක්පොත් ගාස්තුව රු. 10,000 කි.

b. උපලබ්ධි නොවූ චෙක්පත් රු. 65,000 වූ අතර නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් 28,000 ද විය.

10. 2015/2016 වර්ෂය සඳහා බදු වෙන්කිරීම රු. 40,000 ඇස්තමේන්තුගත කර ඇත.
11. අධ්‍යක්ෂවරු 2016.05.13 දින පැවති රැස්වීමේදී පහත යෝජනා ඉදිරිපත් කර තිබේ.

JMC vLearning "your virtual learning partner"

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

– පොදු සංචිතයට රු. 25,000 මාරු කිරීම.

– වරණීය කොටස් මත හිඟ ලාභාංශය හා වර්ෂය අවසානයේ ඇති සාමාන්‍ය කොටස් මත රු. 1 ලාභාංශයක් ප්‍රකාශ කිරීම.

ඔබ විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා

a. 2016.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ලකුණු 10)

b. 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කරන්න. (ලකුණු 15)

(මුළු ලකුණු 25)

උදාහරණ - 48

පහත සඳහන් ශේෂ පිරික්සුම සීමිත වැඩබැරි සමාගමෙන් 2015 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදී.

	හර (රු. 000)	බැර (රු. 000)
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		4,130
- නිදහස් කළහැකි වරණීය කොටස්		1,000
පොදු සංචිතය		420
ප්‍රත්‍යාගනන සංචිතය		150
ලාභාලාභ ගිණුම 2014.04.01		565
15% බැංකු ණය		1,400
විලම්භිත බදු		300
විකුණුම්		15,675
ආරම්භක තොගය	1,260	
ගැණුම්	9,270	
ගෙනවීමේ කුළී	470	
දේපළ, පිරියත හා උපකරණ	8,250	
සමුච්චිත ක්ෂයවීම් - 2014.04.01		1,420
වෙළඳ ණයගැතියෝ හා ණයහිමියෝ	800	450
බෙදාහැරීමේ වියදම්	635	
පරිපාලන වියදම්	815	
වෙනත් මෙහෙයුම් වියදම්	138	
පොළී ගෙවීම්	120	
බැංකු ගාස්තු	145	
බැංකු අයිරා පොළිය	55	
අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස්	200	

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- වරණීය කොටස්	70	
ආදායම් බදු සඳහා වෙන්කිරීම 2014.04.01		135
ගෙවූ බදු	225	
වෙනත් මෙහෙයුම් ආදායම්		15
ආශ්‍රිතයන්හි ආයෝජනය	1,300	
ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ		32
අනෙකුත් මිල ප්‍රකාශිත ආයෝජන	634	
අඩමාණ ණය සඳහා වෙන්කිරීම 2014.04.01		65
රක්ෂණය	122	
කළින් කළ ගෙවීම් හා උපචිත වියදම්	153	33
විදුලිය	66	
අතැති මුදල්	2,100	
බැංකු අයිරාව		1,038
	26,828	26,828

පහත අතිරේක තොරතුරු පවතී.

1. 2015.03.31 දිනට වෙළඳ බඩු තොගයෙහි පිරිවැය රු. 500,000 විය.
2. ඉදිරියට කළ රක්ෂණය රු. 30,000 ක් වු අතර උපචිත විදුලිය රු. 14,000 ක් විය.
3. 2013/2014 වර්ෂය සඳහා සත්‍ය බදු බැඳියාව රු. 160,000 ට එකඟ වී ඇති අතර එය ප්‍රවර්තන වර්ෂය තුළ දී සම්පූර්ණයෙන්ම ගෙවා ඇත. 2014/2015 වර්ෂය සඳහා බදු වෙන් කිරීම රු. 150,000 ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
4. ණයගැතියන්ගෙන් රු. 80,000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතු අතර ඉතිරි ණයගැතියන් සඳහා 10% අඩමාණ ණය වෙන්කිරීමක් කළ යුතුය.
5. 2014.04.01 දිනට දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ තොරතුරු පහත පරිදි විය.

	පිරිවැය / ප්‍රත්‍යාගණන අගය	සමුච්චිත ක්ෂය
සින්නක්කර ඉඩම්	1,500,000	-
ගොඩනැගිලි	2,500,000	625,000
මෝටර් රථ	800,000	380,000
යන්ත්‍රෝපකරණ	1,200,000	300,000
ලී බඩු හා කාර්යාල උපකරණ	1,000,000	115,000
	7,000,000	1,420,000

6. වර්ෂය අග දී ඉඩම් ප්‍රත්‍යාගණනය කළ අතර ප්‍රත්‍යාගණිත අගය රු. 2,000,000 විය. මෙම ප්‍රත්‍යාගණිත අගය පොත්වල නිරූපණය කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා කිසිදු සටහනක් මේ වනතෙක් සිදුකර නැත.

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

7. වර්ෂය මුල් දින රු. 850,000 ක මෝටර් රථ හා රු. 400,000 ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන ඇත. ඊට අමතරව රු. 200,000 වූ යන්ත්‍රෝපකරණ රු. 175,000 ට විකුණූ අතර එහි ධාරණ අගය රු. 150,000 ක් විය. විකිණීමෙන් ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර විකිණීමට සම්බන්ධ වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

8. සමාගම දේපළ, පිරියත හා උපකරණ භාවිතා කළ කාලයට අනුව ක්ෂය කරන අතර වාර්ෂික ක්ෂය වෙන්කරනුයේ පහත ප්‍රතිශතයන්ගෙනි.

ගොඩනැගිලි	- 5%
මෝටර් රථ	- 20%
යන්ත්‍රෝපකරණ	- 25%
ලී බඩු හා කාර්යාල උපකරණ	- 15%

ක්ෂය කිරීමේ දී සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

9. වර්ෂය තුළ දී සාමාන්‍ය කොටස් 50,000 රු. 12 කට නිකුත් කර ඇති අතර, ලද මුදල ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුමට බැර කර ඇත.

10. ගනුදෙනුකරුවෙකු සමඟ ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව භාණ්ඩ සැපයීමට සමාගම අපොහොසත් වී ඇති හෙයින් ගනුදෙනුකරු විසින් සමාගමට එරෙහිව රු. 500,000 ක වන්දි ඉල්ලා නඩුවක් පවරා ඇත. සමාගමේ නීතිඥයන් පවසන්නේ මෙම නඩුවෙහි තීන්දුව පිළිබඳ නිශ්චිත අදහසක් ප්‍රකාශ කළ නොහැකි බවයි.

11. මෙම සමාගමේ වරණීය කොටස් 2016 වර්ෂයේ දී නිදහස් කිරීමට නියමිතව පවතී.

12. 15% බැංකු ණය රු. 200,000 ක වාරික ලෙස අර්ධ වාර්ෂිකව ඊට අදාළ පොලියද සහිතව ගෙවනු ලබයි. මෙම වර්ෂයේ ප්‍රථම අර්ධ වර්ෂයේ වාරිකය හා පොලිය 2014.10.15 දින නිසි පරිදි ගෙවූ අතර දෙවන අර්ධ වර්ෂයේ වාරිකය පොලියද සමඟ 2015.04.15 දින ගෙවීමට නියමිතව පවතී.

13. සමාගම නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයන්

    සාමාන්‍ය කොටස් 280,000

    වරණීය කොටස් 100,000

14. අධ්‍යක්ෂවරුන් 2015.04.20 දින පැවැති රැස්වීමේදී පහත යෝජනා ඉදිරිපත් කරයි.
    - **i.** පොදු සංචිතයට රු. 180,000 ක් මාරු කිරීම.
    - **ii.** වරණීය කොටස්හිමියන්ට හිඟ ලාභාංශය ප්‍රකාශ කිරීම. කොටසකට රු. 1.50 ක වාර්ෂික ලාභාංශයක් හිමි වේ.
    - **iii.** සාමාන්‍ය කොටසක් මත රු. 1.25 ලාභාංශයක් යෝජනා කිරීම.

16. මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට බලය පවරන ලද්දේ 2015.06.20 දිනදීය.

ඔබ විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පහත දෑ පිළියෙල කරන්න.

i. 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ii. 2015.03.31 දිනට ශේෂ පත්‍රය

© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd